# සුභාසිතය

1 සතමෙව්න පත මෙත සඟ හස සෙවී පයි දු
අව්හ ත සුර මතැ මිනි තරසරපුබු දු
දිගු රතැ ගිලි දල පෙල මොක් සුවඳ රැ දු
සි ය පත සිය,සිය පත සිය පත නැම දු

1 සතමෙව්න, සත්වයාකාරා, පත, පැමිනියාවූ මෙත, මෛත්‍රීඇති, පසිඳු, ප්‍රසිද්ධවූ, සඟහස, සඞ්ඝනැමති, හංසයන් විසිං, සෙවි, සේවනයකරනලද්දාවූ, අවනත( නමස්කාර වසයෙන් ), නැමුණාවූ, සුරමත, දෙවියන්ගේමස්තකයෙහි, මිනිතරසර, මානික්‍යරැස්මිනැමැතිවිලෙහි, පුබුදු, පිපුනාවූ, දිගු, දික්වූ, රතැගිලිදලපෙල, රතුඇගිලිනැමැති.පත්‍රපත්හිඇති, මොක්සුවඳරැඳු, නිවන්නැමැතිසුවඳින්රැඳුනාවූ, සියපතසියසිය, සූසැටිබත්බුහුගේ නොවත්බුදුන්ගේ පතසියපත, පාදනමැතිපද්මය නමදු, නමස්කාරකරණ

2 උ තු ම් දහම්රජ මුව ගිරගින් පහ ළ
අ ද ම් මගිම්හල මොක්වෙරල නිහුදු ළ
නොනිම් සියුම් නායම්හිපද අරුත්ර ළ
ස ද ම් සදම්ගඟ මමුදුනැබැනිතිද ළ

2 උතුම්දහම්රජ උතුම්වධර්මරජයාණන් මුවගිරගින් මුඛනැමති පර්වතා ග්‍රයෙන් පහළ පහළවූ අදම්මගින් හල අධර් නාමැති ග්‍රීෂ්මදුරැකලාවූ මොක්වෙරලනිත් නිවන්නාමැති වෙරලින් උදුල බබලනනාවූ, නොනිම්,නොකෙලවරක්නැති, සියුම්නයම්හි, සූක්ෂමවූ නුවනමැති, මානික්‍යඇති, පදඅරැත්රල, පදාර්ථනමැති, තරඞ්ගඇති සදම්ගඟ; සද්ධර්

ණෑතිශයාව, දලබැතිනි, මහත්භක්තියෙන්, මේ මුදුනෑ, මාගේමස්තයෙහි, සදම්, සජ්ජීතකෙරෙමි—

3 සිය පත් සැදු බඹසුරනර උරගම ත
සැරි යු ත් මහමුගලන් පිළි වෙළිනිප ත
පිළි වෙත් සරූ මහසඟනට මුනිඳුසු ත
මුදු නත් දි බැතියෙන් නමදිමියත ත

3 බඹසුරනරඋරග, බ්‍රහ්මදේවනරනාගයන්ගේ, මත, මස්තකයෙහි, සියපත්සැදු, සංඛ්‍යීය පාදයසැදුවාවූ, සැරියුත් මහමුගලන් පිළිවෙළිනි, සැරියුත්මහමුගලන්, පරම්පරාවෙන්, පත, පැමුනුණාවූ, පිළිවෙත්සරූ පිළිවෙත්සාරවූ, මුනිඳුසුත, බුධපුත්‍රවූ මහාසඟනට, මහාසඞ්ඝයාත්ට, සතත, නිරන්තරයෙං, මුදුනත්දී, මුදුනනතාබා, බැතියෙන් භක්තියෙන් නමදිමි, නමස්කාරකෙරෙමි—

4 ස ත් අ ත් තිනෙත් සතරත් ණත් සිසිරක ර
ප ත් ම ත් සවත් විදුරත් පුත් තුසරක ර
ව ත් අ ත් තලත් කිම්රත් ගත් ගුරුඅම ර
සෙත්දෙත් මෙසත් සුරසත්සිත් ලෙසනිත ර

4 සත්අත්, බ්‍රහ්මයා, තිණෙත්, ඊශ්වරයා, සතරත්, විෂ්නුයා, ණත්, අනන්තනාමිණාගරාජයාය, සිසිරකර' චන්ද්‍රයා, පත්මත්, සූර්‍ය්‍යයා, සවත්, ස්කන්දකුමාරයා, විදුරත්, සක්‍රයා තුසරකරපුත්, බුදහුය, වත්අත්, ගනේශ්වරයා, තලත්, බලභද්‍රයා, කිම්, සුක්‍රයා, රත්ගත්, කුජයා, අමරගුරූ, වෘහස්පතියා, (යන)මෙසත්සුර, මේ යහපත්දෙවිවරූ, සත්සිත් ලෙස, සත්වයාගේ සිත්වූ පරිද්දෙන්, නිතර, නිරන්තරයෙන්, සෙත්දෙත්, ශාන්තිදානය කෙරෙත්වා—

5 ප හ ල පොරණ ඉසිවරමුවෙනි මනණ ද
දෙ ම ල සකුමගද ණොහසල සතව ද
පු ව ල් නිතිසතගත පද් අරුත්ලෙ ද
සි හ ල බසින් සැකැවින් කියමි පදබැ ද

5 මණහද, සිත්සතුටුකරනහාවූ, පොරණගුරුවරවූවෙණ, පුරාණ පාඝිවරයන්ගේමුඛයෙන්, පහල, පහලවූ, දෙමලසකු මගද ගණහසල, දෙමල සංස්කෘත පාලි පූරුදුනැහාවූ දද, සතව, අනුවණසචයාව, පූවල, මහත්වූ. නීතිසත, නීතිශාස්ත්‍රයාගේ, ගතපද, ග්‍රන්ථපදයන්හී, අරුත්ලෙද, අභිවිලාසය, සැකෙවින්, සංක්ෂෙපයෙන්, සිහලබසිං,සිංහලභාෂාවෙන්, පදබැඳ, පදබන්ධණයකොට, කියමි කථනයකරමි—

6 එබැවී න් සෙබෙහි වියතිනි ගුණයුත් පව ර
කිරියෙ න් දියර වෙන් කලහස මෙන්පත ර
මවිසි න් කියණ මෙහි වරදක් දුටත්හැ ර
සංතොසින් අසවූ පදරුත් විමසාගැඹ ර

6 එබැවින්, එසේහෙයින්, සෙබෙහි, සභාවෙහි, පවර, උතුම්වූ, ගුණයුත්, ගුණයෙන්යුක්තවූ, වියතිනි, පණ්ඩිතවරුනි කිරියෙන්, කිරෙන් දියර, ජලය, වෙන්කල, වෙන්කලාවූ පතර, මහත්වූ; හසමෙන්, හංසයෝමෙන්, මවිසින්කියණ මාවිසින්කියනහාවූ, මෙහි, මේකාව්‍යයෙහි, වරදක්, වැරැද්දක්, දුටත්, දුටුවත්, හැර, අත්හැර ගැඹර, ගාම්භීරවූ පදරුත්, පදාර්ථයන්, විමසා, පරීක්ෂාකොට, සතොසින්, සන්තෝසයෙන්, අසව් ශ්‍රවණයකරවූ—

7 ප බ ඳ කිවින් බැඳිකව් රසෙහිවිසිතු රැ
ස බ ඳ විදුදහෝ පලකෙරෙහි දියතු රැ
ගණමද රසින්දිවියුරු පොබයන්තඹු රැ
සු ව ඳ දිගතවිහිදය් හමණමදම රැ

7 දිවයුරු, සූර්‍ය්‍යතෙම, තොමදරසින්, බොහෝවූරස්මියෙන්, තඹුරු, රෙනෙළුම්මල්, පොබයන්, ප්‍රබෝධකරන්, හමනමදමරු, හමනහාවූමදසුලඟතෙම, දිගත, දිගාන්තරයෙහි, සුවඳ,සුගන්ධය,විහිදය්,විහිදවය්,(එමෙන් පබඳ,ප්‍රසිද්ධවූ,කිවි

ත්, කාව්‍යකාරයන්විසින්, බැඳි, බැඳුවූ, කවිරසෙහි,
කාව්‍යරසයෙහි, විසිතුරු, විචිත්‍රය, සබඳ, සම්බන්ධවූ,
ගුණනොත්මිත්‍රවූ, විදුදනෝ, පඬිනජණයෝ, දියතුරු,
ලෝකයඅතරෙහි, පලකෙරෙති, ප්‍රකාසකරෙත්ය—

8 කිවි පද බැඳුත් ගුනදොස කිවිදෝම මී ස
නැණමද සුකවි දූනගනහෙති කවරලෙ ස
ද රැ ල ද අඟණෝම මිස පසවෙහිවෙනෙ ස
ව ඳ ල ඳ ගනෝ දූණනනනෙහි කවරලෙ ස

8 දරුලදඅඟණෝමමිස, දරුවන්ලත්ඉස්ත්‍රීනුමම්සක්, පසවෙහිවෙනෙය, ප්‍රසවයෙහි, (වැදීමෙහි)වෙනෙසය, වඳලඳගණෝ, වඳවූද, බාල වූදඉස්ත්‍රීනු, කවරලෙස, ෆකාශ් ආකාරයෙන්, දූණගනනෙහි, දූනගනහෙද්ද, ණෝහෙත්මය එමෙන් කිවි, කවින්ගේ, පදබැඳුම්, පදබැඳීමෙහි, ගුනදොස, ගුණදොෂය, කිවිදොමම්ය, කවීන්‍යෝමම්සක්, නැණමද, නුවණමදවූ, කුකවි, නින්දිතකවිනු, කවරලෙස කවරාකාරයෙන්, දූණගනහෙති, දූනගනහෙද්ද, ණෝහෙත්මය—

9 උ තු. මි නිවන්ඇප සපයාදෙණ මහ ත
ද හ මි රජසමයනොගනිති කුදිටුස ත
නො හිමි සුවඳවිහිදෙණ සිරිරුදිදිමු ත
පි යු මි වෙනෙහි නිලමැසිකැල ඉණෝහැසිරෙ ත

9 ණෝහිමි, ඉමක්නැනනාවූ, සුවඳවිහිදෙණ, සුගන්ධවිහිදෙනනාවූ, සිරිරුදි, ශ්‍රීරූපුණාවූ, දිමුන, දිප්තිමත්වූ, පියුම්වෙනෙහි, පද්මවණයෙහි, නිලමැසිකැල, නීලමැසියමුහයෝ, නොනැසිරෙත, ණෝහැසිරෙත්ය, ( එමෙන් )උතුම් උසනාවූ, නිවන්සැප, නිර්‍වාණසැපය; සපයාදෙන, ලබාදෙනනාවූ, මහත, මහත්වූ, දහම්රජසමය, ධර්මරජ හුගේ, බුදුන්ගේ ආගම, කුදිටුසන, මිථ්‍යාදෘෂ්ටිසත්වයෝ, ණෝගනිති, නොගනිත්ය—

10 රූ ව ත් මිලනොදත්අනුවණදනවෙල ද
ලොබි න් කඳුමැටිමිනියන් රැගත්ලෙ ද
ප ස න් මුනිවරන්හැරැ අත්සුරන්වැ ද
නි ව න් පතාඅනුවණසතකරනලෙ ද

10 පසන්මුනිවරන්හැරැ, ප්‍රසන්නවූ සර්‍වඥවරයන්අත්හැර අත්සුරන්වැඳ, වෙණදෙවිවරුනනමස්කාරකොට, අනුවනසත, අඥණසත්වයාවිසින්, නිවන්පතා, නිර්වාණප්‍රාර්ථණාකොට, කරනලෙද, කරන්නාවූලෙස, කෙසේද රුවන්මිලණොදත්' මැනික්වලඅගේනොදන්නාවූ, අනුවණ, අඥනවූ, වෙලඳදණ, වානිජ්ජණයා ලොබින්, ලෝභයෙන්, කඳුමැටි, එනම්මැටි මිනියයි, මැනික්යයිසිතා, රැගත්ලෙද, හැරගන්නාක්වැනිය—

11 න ද න මුනිඳුහැරඅත්සුරණවපැව ත
නි ව න පතා අනුවණසතකරනතැ ත
ල බ න පිනියතෙල්ලොබ වඩවම්නිසි ත
ම හි න වැනනවැලිමඑ ලම්නිතෙලිය ත

11 නදණමුනිඳු, සතුටුඑලවනනාවූබුදුන්, හැරැ, අත්හැර, නිවණපතා, නිර්වානප්‍රාර්ථනාකොට, අත්සුරණව, වෙනදෙවිවරුන්ට, පැවත, පැවිහි, අනුවණසත, අඥණජනයාවිසින්, කරනතැත, කරනනාවූඋත්සාහය, (කෙසේද) තෙල්ලබණපිනිස, තෙලලැබීමට, සිත, සිතෙනි, ලොබවඩවම්නී, ලෝභවඩවමින්, තෙලියත, තෛලයන්හුයෙහි, (පැහේ) වැලිමඑලම්නි, වැලිමඑදමමින්, මඩිණවැත්ත, මිරිකනනාක්වැනිය—

12 සක ල සුරනරන් මුදුණනැසැදුප ද
වි පු ල මුනිසරණහැරැ අන්සුරන්වැ ද
නිම ල මොක්පිනිස සතරකිණාදුල ද
දි බු ල මලනිසාවෙහෙසුනු වැනිදියැ ද

12 සකලසුරණරන්, සියඑදෙවිමිනිසුන්ගේ, මුදුණනැ, මුදුනතිහි, සැදුපද, සදණලපාදඇතනාවූ, විපුලමුනි, මහ

ත්බුදුන්ගේ, සරන, සරණය, හැරැ, අත්හැර, අන්ශූර
ත්වැඳ, වෙණදෙව්වරුනනමස්කාර කොට, නිමලමොක් පි
නිනනිමිලවූනිර්වානයපිනිය,සතරකිණ,සත්වයාවිසිංරක්‍ෂාකර
නනාවූ, දුලද, මිත්ථ තප්‍රිශ්ටිය, ( කෙසේද ) දිඹුළමලනි
සා, අත්නිකකාමල්ථදෙසා, දියැද, චතුරඇද, වෙහෙසු
නුවැනි, වෙහෙසුණොක්වැනන—

13 පු ත් පිරිසිඳුසිල්මුල්ගුණකඳිත්යු තී
ද ත් කමනැනකුරුමල්සාමඹුඑඇ තී
පි ත් කප්තුරු සගමොක්පලදෙනකැම ති
ම ත් සුදනත්මෙත් සිලිලෙත්වැඩෙයිනි ති

13 පුත්, පිරුණාවූ, පිරිසිඳු, පවිත්‍රවූ, සිල්මුල්, සීලන
මැතිමුල්ඇති, ගුණකඳිත්යුගී ගුනනමැතිකඳිත්යුක්තවූ,
දාකමනැන දැණක්‍ෂමාඥනනැමති, අකුරුමල්සාමඹුඑඇ
ති, අඞ්කුර පුෂ්ප සාඛා මඩල ඇතතාවූ, කැමතීකැමතිවූ;
සගමොක්පල, ස්වර්ගමොක්‍ෂපලයන්, දෙණ, දෙනනාවූ, පින්
කප්තුරු, කුසල්නැමතිකල්පවෘක්‍ෂය, සුදනත්, 'සත්පුරුෂයන්
ගේ, මත්, සිත්හි, මෙත්සිලිලෙත්, මෛත්‍රීනැමතිජලයෙන්,
නිති, නිතර, වැඩෙස්, වර්ධණවෙයි—

14 පි ය ක ර සතරබඹවිහරන්සිවූපෙදෙ ති
වැරසැ ර නැනයුවලදලදිලිදම්සොඬි ති
පු ව ත ර තුමුලමනවරනිඳුටනැගෙමි ති
ම න හ ර සෙත්පුරව පැමිනෙව්සව්සතු ති

14 පියකර, පියකරුවූ, සතරබඹවිහරන්සිවූපෙණෙදනි, සතර
බ්‍රහ්මවිහරණනැමතිපාදසතරක්ඇති, වැරසැරනැණයුවලං
දල, විසාරයඥාණය නමැති, දනයුගලයක්ඇතනාවූ, දම්
සොඬිනි, ධර්මනැමතිසොඬින්, දිලි, දීප්තිමත්වූ, පුවතර
ප්‍රසිද්ධවූ, තුමුල, මහත්වූ, මනවරනිඳුට, මනනහස්තිරාජය
ට, නැගෙමිනි, නැගීමින්, සවුසතුනි, සියළුසත්වයිනි, ම
නහර, සිත්ගනනාවූ, සෙත්පුරට, නිර්වාණපුරයට, පැ මී

ගෙනවූ, ප්‍රාප්තවවූ—

15 නි දෙ ස් ගුණබරනසදහම්කිරුළද ග
වෙ සෙ ස් සිල්සෙනගගෙනෑමෙත්තුරඟඅ ග
කෙලෙ ස් රුපුන් සිඳෑනැනකඟිනි නොමහෑ ග
සතො ස් රජසිරිස්පැමිණෙව්නිවන්පු ග

15 නිදෙස්ගුනබරන, නිර්දොෂගුනනැමති, ආභරනය හා, සදහම්කිරුළ, සද්ධර්මනැමතිඔටුනනද, දරා, ධාරනයකොට, වෙසෙස්, ප්‍රභෙද්වූ, සිල්සෙනඟ, ශීලනැමතිසේණාවගෙනෑ, ග්‍රහනයකොට, මෙත්තුරඟඅරා, මෛත්‍රීනැමතිඅසවයාටනැඟී, කෙලෙස්රුපුන්, කෙලෙස්නැමතිසතුරන්, නැනකඟිනි, ඥානනැමතිකඩුවෙන්, නොමහැරා අත්නොහැර, සිඳෑ, ඡෙදනයකොට,:( සතො )ස තොස්රජසිරින්, සන්තොසවූරාජලීලාවෙන් නිවන්පුරා, නිර්වාණපුරයට, පැමිණෙව්, ප්‍රාප්තවව්—

16 ඇ ත ත් නැතත්පරලොවසුදනනිමහ ත
හලො ත් යෙහෙකි පවුකම්නොතබාමයි ත
නැත ත් එපරලොව ඉත්වනඅවැඩනෑ ත
ඇතො ත් නැතැය් පවුකලහාටවෙය්විප ත

16 මහත, මහත්වූ, සුදනනි, සත්පුරුෂයනි, පරලොව ,පරලෝකය, ඇතත්නැතත්, ඇගිනුමුත්නැගිනුමුත්, පව්කාපාපකර්ම්ය, සිත, සිතෙහි, නොතබාම, නැබීමනොගෙනාවම හලොත්, හැරියහොත්, යෙහෙකි, යහපතකි, එපරලොව ඒපරලෝකය, නැතත්, නැගිනුමුත්, ඉත්වන, එයිත්වනනාවූ, අවැඩ අවැඩෙක්, නැත, නැත්තේය. ඇතොත් (ඒපරලෝකය) ඇත්තේනම්, නැතැය්පවුකලහට, නැත්තේයකියා, පාපකලනැනතානුට, විපතවෙය්, විපත්තිය වෙය්—

17 නැගෙ න ත් අවරගිරගින් දිනකරමඬ ල
පි පෙ න ත් ගිරිමුදුනෑ හෙල්මැලි පියුමුපු ල

සැ ලෙන ත් සුරණෝරපවනිත් සඳෙනෙත් අත ල
බොරුනැ ත් නෙමයමහතුන්පැවසුනෙපුල ල

17 අවරගිරගින්, අපරපර්වතාග්‍රයෙන්, දිණකරමඬල, සූ
යබිම්බමණ්ඩලය, නැගෙනන්, උත්ගතවෙතත්, ගිරිමුදුනැ
පර්වතමුදුනෙහි, නෙල්මැලිපියුම්පුල, නෙල්මැලිදණේඑම්ද
මහනෙල්ද, පිපෙනත්, පිපිමවෙනත්, සුරණෝර, මහමේරු
ව, පවනින්, සුලඟින්, සැලෙනත් චංචලවෙනත්, අතල
ගින්ණෙන්; සඳෙහත්, සෙවෙල්ඵනත්, මහතුන්, මහාත්
මයන්විසින්, පැවසූකියනලද, නෙපුල, වචනය,
බොරුනැත්තෙමය, බොරුනැත්තේමය—

18 පිරිවරසෙ ත් රකිණාපිනිස නිරතු රු
පෙරනියම් ත් නිරිඳෝරැගනිතිපඩු රු
සියගුනයෙ ත් වසිණාවැසිමෙදියතු රු
සියකිර නි ත් දේරනනරයගතියහි රු

18 සියගුනයෙන්, සියක්ගුණයෙන් වසිනාවැසි, වසිනවරු
සාඇති, මෙදියතුරු, මේලෝකයඅතරෙහි, දෙරනත, භූමි
යෙහි, රස, රසය, කිරු, සූර්‍යයාතෙම, සියකිරනින්, තමාගේ
රශ්මියෙන්, ගතිය, හැරගනිය, (එමෙන්)නිරතුරු, නිරන්
තරයෙන්, පිරිවරසෙන්, පරිවාරශේණාව, රකිනාපිනිස
රක්‍ෂාකරනපිනිස, නිරිඳෝ, නරේන්‍ද්‍රයෝ, පෙරනියමින්,
පූර්විනියමවූපරිද්දෙන්, පඩුරු, පනානාකාර, රැගසිහි, හැ
රගනිත්ය—

19 කොතෙක් වෙහෙසලදුවත් සුදනෝපව ර
උ ද ක් ලොවසතුන් සිනැලුක් කෙරෙතිදු ර
ප සක් රාහුමුවපත්වම්හි බියක ර
අ නි ක් පසින්නොවහෙජිගෙනරෙයහිමක ර

19 බියකර, භයඞ්කරවූ, රාහුමුව, රාහුගේමුඛයට, පසක්,
පාර්ශ්වයකින්, පත්වෙම්හි, ප්‍රාප්තවෙමින්, අනික්පසින්, අ
නික්පාර්ශ්වයෙන්, හිමකර, චන්‍ද්‍රතෙම, ලොව, ලෝකය,

හෙළිකෙරෙය, එළිකෙරෙයි, ( එමෙන් ) පවර, උතුම්වූ, සුදනෝ, සත්පුරුෂයෝ, නොපෙනෙක්වෙහෙසලදුවත්, නොපමනවිහෙසලදමුත්, උදක්, තනිකර, ලොවසතුන්, ලොක සත්වයන්ගේ, සිතැදුක්, සිත්හිදුකදුරුකෙරෙති, ඉවත්කෙරෙත්ය—

20 පි ත් ම ද පු තු න් සියසක්ලදුවත්නිස රැ
ගුණනැනබෙලෙන් පුතුපුතුමයදූනාන රැ
එ ක පු ත් ස දි න් දුරුවෙයි ලොවැගණඅඳුරු රැ
නොක තරු රැසි න් එළෙසට නොමවෙයදු රැ

20 ලොවැ, ලෝකයෙහි, ගණඳුරැ, ඝණාන්ධකාරය, එකපුත්සඳින්, එකපුර්ණ්‍ණ චන්ද්‍රයා කරණකොටගෙන, දුරුවෙයි, පහවෙයි, නොකතරුරැසින්, නොයෙක් තාරකා රාසියෙන්, එලෙසට, ඒආකාරයට, දුරුනොවෙයි, පහනොවෙයි, (එමෙන්) පිත්මද, පිත්මදිවූ, පුතුන්, පුත්‍රයන්, සියසක්, සියයක්, ලදුවත්, ලැබූවත්, නිසරු, නිස්සාරය, ඉනාගරු, ඉනාගරුකළුපුතුවූයෙ, ගුණනැනබෙලෙන්, ගුණයෙන්ද නුවණින්ද බලයෙන්ද, පුතු, පුතුවූ, පුතුමයි, පුත්‍රයාමයි—

21 විපුල නැනැතිමහතුත්හට පත් විත ත
නිස ල නැතින් යුතු උතුමෝම දුරල ත
ක ලල ගිළිනූ මහවරනිඳුගොඩ ගනු ත
තු මුල බලැති තිජ්දෙක්මිස අත්කෙව ත

21 කලලගිළිනූ, මඩෙහිගිළිනාවූ, මහවරනිඳු, මහාහස්තිරාජයා, ගොඩගනුත, ගොඩගනිතහොත්, තුමුලබලැති, මහත්බලඇතතාවූ, තිජ්දෙක්මිස, ගජේන්ද්‍රයෙක්මිසක්, අන්කෙවත, වෙනකවරෙක්පොහොසත්ද, ( එමෙන් ) විපුලනැනැති, මහත්නුවනඇතතාවූ, මහතුත්හට, මහාත්මයන්ට, පත්විත, පැමිනිමින්නිය, නිසලනැතින්, නිශ්චලනුවණින්, යුතු, යුක්තවූ, උතුමෝම, උත්තමයෝම, දුරලත, දුරලති—

22 කුළුණුගුණෙන් යුතුඋතුමන්සිතමෙන රෑ
දුද නා බ සි න් නොයෙදෙයි නරණවනපු රෑ
නව්රුව නි න් පිරිමහසමුදුරගැඹු රෑ
නනසුල කි න් හුණුකලහැකිවෙදකවු රෑ

22 නවරුවනින්, නවරත්නයෙන්,පිරි,පිරුනාවූ, ගැඹුරු, ගාම්භීරවූ, මහසමුදුර, මහාසමුද්‍රය, තනසුලකින්,තනකො ළපත්දමකින්, කවුරු, කවුරුන්විසින්, හුණුකලහැකි වෙ ද,චූර්ණකලහැකිනුලැබේද,(නොලෑබෙයි) (එමෙන්) ම හරු, පූජ්‍යවූ, කුළුණුගුණෙන්, කරුණාගුණයෙන්, යුතු, යුක්තවූ, උතුමන්, උත්තමයන්ගෙ, සිතු, චිත්තය, දුදනබසි න්, දුර්ජනයන්ගෙවචනයෙන්, නපුරුකරනට, නපුරුදේ කිරීමට, නොයෙදෙයි, යෙදීමනොවෙයි.

23 සු ර තු රු ව න් උතුමෙකුදෙන දනින්මි ස
ය දී කා ලි ම න් කෙසෙ දුරුවෙදමුලින්පි ස
මහ මෙ ය කි න් පහවනගෙනෙහි සරතෑ ස
පි නි බි ඳ කි න් වැලකියහැකි වෙදගේලෙ ස

23 මහමෙයකින්, මහාමේඝයෙකින්, පහවන, පහවත්නාවූ, ගනෙහි, සැරීරයෙහි, සරතෑස, ශ්‍රීෂ්මය, පිනිබිඳකින්, පිනි බින්දුවකින්, කෙලෙස, කවරආකාරයකින්, වැලකියහැකිවෙ ද, වැළැක්වියහැකිවනුලැබේද, (නොලබේමය) (එමෙන්) සුරතුරුවන්, දිව්‍යවෘක්‍ෂයක්වැනිවූ, උතුමෙකු, උත්තමයෙකු විසින්, දෙන, දෙන්නාවූ, දනින්මිස, දානයෙන්මිසක්, යදි කාලිමන්, යාචකයන්ගේලෝභසිත, මුලින්පිස, මුලිංසුන්ව, කෙසේදුරුවේද, කෙසේදුරුවනුලැබේද, (නොලබේමය,

24 දියනෙත උදාවන සිසකිරනින්මහ රෑ
මෙදි යන දිවාබිඳුරුවෙයි ගනඅඳු රෑ
සිරි ව න රජතුමෙකු දුටුපමනින්සොඳු රෑ
ඇතුලත පිටත දිවරු හැරෙයදුකඳු රෑ

24 මනරැ, මනෝඥවූ, හිමකිරනින්, සීතරශ්මියෙන්, දිය
නෙන, සුසඩා, උදවන, උදවූකල්හි, මෙදියන, මේලෝක
යෙහි, දිවා, දවල්, තිබ්බිපිවන, ගනඳුරැ, සඤානාන්ධකාරය දු
රුවෙයි, දුරීභූතවෙයි, සොඳුරු, සුන්දරවූ, සිරිමත, ශ්‍රීමත්
නවූ, රජතුමෙකු, රාජෝත්තමයකු, දුටුපමණින්, දුටුවාවූපම
ණින්, දිමරැ, දවල්දරාත්‍රියෙහිද, ඇතුලතපිටන, ඇතුල
දපිටතද, දුකඳුරු, දුඃඛාන්ධකාරය, හැරෙය, පහවේ,—

25 කුළු නෙත් ගුනෙත්නුවනින්පසිඳු හැමතැ
සුදනන් සෙව්න නිරිඳෝලෙව්සන රකි
දෙහි රුත් මලින් රොත්ගෙනයනමෙන් සැම්
නියමින් අයගනිති සනසිනනොනළමි

25 දෙහිරුත්, භෘඞ්ගයන්විසින්, පෙමින, පෙමින්, ප්‍රී
ත්, ප්‍රීත්‍යයෙන්, රොත්ගෙනෑ, රේණුගෙන, යනමෙන්, ය
ත්නාක්මෙන්, සැමතැන, සැමතැත්හි, කුළුනෙත්, කරු
ණාවෙත්ද, ගුනෙත් ගුණයෙන්ද, නුවණින්, ඥානයෙන්ද, ප
සිඳු, ප්‍රසිද්ධවූ, සුදනන්, සත්පුරුෂයන්විසින්, සෙව්න, සේ
වනයකරණලද්දාවූ, ලෙව්සනරකින, ලෝකසත්වයාරක්ෂා
කරන්නාවූ, නිරිඳෝ, නරේන්ද්‍රයෝ, සනසින, සත්වයාගේචි
ත්තය, නොනලමින, පීඩානොකරමින්, නියමින්, නියමවූ
පරිද්දෙන්, අයගනිති, අයගැනීමකෙරෙති—

26 අමයුත් රසඅහරවන් වඩවන ඔද
කුසැ ගත් ගිනි නිවනපමනට බුදීනලෙ
නොද කිත් පතලනිරිඳෝකොමද දනරැ
නොකරෙත්ලොවසතුත් රකිනා සතරම්

26 ඔදසවඩන, ඕජස්වඞ්නයකරවන්නාවූ, අමයුත්, අමෘ
තය, (දිව්‍යආහාරය) සමානවූ, රසආහරවත්, රසආහාරය
නමුත්, කුසැ, කුසෙහි, ගත්, ගත්තාවූ, ගිනි, ගින්න, නිවනපම
නට, නිවන්නාවූප්‍රමාණයට, බුදිනලෙස, අනුභවකරන්නාක්

මෙන්, තෙදකින්, තේජකීර්තියෙන්, පතල, පතළාවූ, නිරිඳෙන්, නරේන්ද්‍රයෝ. ලොවසතුන්, ලෝකසත්වයන්, රකිනාවිනරම්ය, රක්‍ෂාකරණප්‍රමාණයට මිසක්, නොමදදන, බොහෝවස්තුව, රැස්නොකරෙත්, රැසිනොකරෙති—

27 පැ න ස ර නොවන නිරිඳුන් ලදරජසැප න
ගො රත ර නිරාදුකවත් වැඩියෙත්විප න
නි ර ස ර නැනැති නරවරලදඑමසැප න
සු ර පු ර සැපතටත් සියගුණෙනියහප න

27 පැනසරනොවන, ප්‍රඥාසාරනොවින්නාවූ, නිරිඳුන්, රජුන්, ලද, ලද්දාවූ, රජසැපත, රාජ්‍යසම්පත්තිය, ගොරතරා ඉතානයඩිකාවූ, නිරාදුකවත් වැඩියෙන්, නරකදුඃඛයටත්වඩා, විපත, විපත්තියෙක, නිරසර, ඉස්ව්රසාවූ, නැනැති, නුවනඇත්තාවූ, නරවර, නරොත්තමයන්, ලද, ලද්දාවූ, එමසැපත, එමසම්පත්තිය, සුරපුරසැපතටත්, දිව්‍යපුරසම්පත්තියටත්, (වඩා) සියගුණෙනි, සියක්ගුණයෙන්, යහපත යහපත්ය—

28 බැළු මෙ න් සිහිකිරි මෙන් පහසින් නිති න
ස සු ත න් රකිනමින්කුමුසියොතුන්ලෙසි න
කු ළු නෙත් ගුනනැනින් යුතුඋතුමෝසොබ න
වෙ සෙ සින් ලොවසතන් රැකැපවතිත් නොසි න

28 නිතින, නිරන්තරයෙන්, බැළුමෙන්, බැලීමෙන්ද, සිහිකිරිමෙන්, සිහිකිරිමෙන්ද, පහසින්, ඉස්පර්ශයෙන්ද, සසුතන්, නමන්ගේදරුවන්, රකින, රක්‍ෂා කරන්නාවූ, මිත්, මිත්‍රයෝද, කුමු, කුම්භයද, සියොතුන්, පක්‍ෂීද, ලෙසින, පරිද්දෙන්, කුළුනෙන්, කරුනාවෙන්ද, ගුනනැනින්, ගුනයෙන්ඥානයෙන්ද, යුතු, යුක්තවූ, සොබන, යහපත්වූ, උතුමෝ, උත්තමයෝ, නොසින, නස්නොයෙන්, වෙසෙසින්, විශිෂ්ටයෙන්, ලොසතුන්, ලෝකසත්වයන්, රැකැ, රක්‍ෂාකොට, පවතිත්, ප්‍රවෘත්තිනවෙත්—

29 සම වත වැසිසුලඟකෙත් වත් වැවෙතමෙ න
ලොව සත රැකෙයි නිසිරජනැනැති මැතිගෙ න
එ මහ ත නලනලින් වනදහනවනමෙ න
දුසිරි ත රජකු මැතිගෙන් නසියසැමනැ න

29 . වැසිසුලඟ, වරුසාවහාසුලඟ, සමවත, සමානවපවත් නාකල්හි, කෙත්වත්, කෙත්හාවතු, වැවෙතමෙත, වැවෙත්නාක්මෙන්, නිසි, සුදුසුවූ, රජ, රජුහා, නැනැති, නුවනැතතාවූ, මැතිගෙන, මන්ත්‍රීයාගෙන්ද, ලොවසත, ලෝකසත්වයා, රැකෙයි, රක්‍ෂාවෙයි, මහත, මහත්වූ, අනලනලින්, ඒසුලඟින්හාගින්නෙන්, වණ, වණය, දහනවනමෙන, දවෙත්නාක්මෙන්, දුසිරිත, නපුරුපැවතුම්ඇතතාවූ, රජ, රජුහා, කුමැතිගෙන්, නපුරුමන්ත්‍රීයාගෙන්ද, සැමනැන, සියළුඑනැන, නසිය, නැසෙයි—

30 නුව නැ ත් තවූත්පහකොට දුදනන්සෙවූ න
නො මහත් සිතතුලෙහි ගුනපොකුරඹලෙසි න
මැ ද හ ත් නොව මසුරුගුනයෙන් දවසරි න
ර ජු ව ත් ඇ තොරවත් අතුරක්නැතවෙති න

30 නුවනැත්තවූත්, ඥානවන්තයන්, පහකොට, දුරුකොට, දුදනන්, දුර්ජනයන්, සෙවුන, සේවනයකරණ්ණාවූ, සිතතුලෙහි, සිත්අතරෙහි, පොකුරඹලෙසින, නෙළුම්පතෙහිදියක්මෙන්, ගුණ, ගුණය, නොමගත්, නොගත්තාවූ, මැදහත්නොවැ, මධ්‍යස්ථනොව, මසුරුගුණයෙන්, මසුරුකමින්, දවසරින, දවස්යවන්නාවූ, රජුවත්, රාජයාවත්, ඇතොරවත්, අන්තඃපුරස්ත්‍රීන්වත්, වෙනින, (ඔවුන්ගෙ ඒ පැවැත්මම්ය) වෙතින්, අතුරක්, අන්තරාවක්, නැත, නැත්තේය—

31 . පැමිනෙන ලොවට බුහෝ ගුණයුතුනපු රැ
මෙ දි ය න නසිනුම්ය යහපත නොමෙව්ය රැ

නොනැවන සුනනෑ පත්වූසඳෙහි සත්ගි රෑ
වි ක සි ත නොවී දුයෙසි සැමනෑනතඹු රෑ

31 සුනනෑ, සුනාන්තයෙහි, සත්ගිරෑ, සප්තසුරඤ්ඤියත්, පත්වූසඳෙහි, පැමුනුනුකල්හි, නොනැවන, නොනැවතී, සැමනෑනෑ, සැමතෑත්ගී, තඹුරෑ, නෙළුම්මල්, විකසිතනොවී, නොපිපි, දුයෙසි, දැවීයෙසි, (එමෙන්) නපුරෑ ගුනයුතු, නපුරෑගුණයෙන් යුක්තවූ, බූනා රජුන්, ලොවට, ලෝකයට, පැමිනෙන, පැමිනිකල්හි, මෙදියත, මේලෝකය, නසිනුම්ඟ, නෑසෙනුම්සක්, සරෑ, සාරවූ, යහපත, යහපතෙක්, නොවේ, නොවෙසි—

32 රෑදුරෑ ගිනිකඳක් ගත්සඳෙහි වණතු රෑ
මිතුරෑ වේය දිගතිත්හමණ මදම් රෑ
මිතුරෑ නෑසීමට එක්වෙයි පසමිතු රෑ
මිතුරෑ නෑකෙනෙක් නිවතුත්හට කවු රෑ

32 වණතුරෑ, වනාන්තරය, රෑදුරෑ, රෞද්‍රවූ, ගිනිකඳක්, වන්නිස්බත්ධයක්, ගත්සඳෙහි, ගත්තාවූකල්හි, දිගතිත්, දිගාන්තයෙන්, හමණ, හමන්නාවූ, මදමරෑ, මදසුලඟ, මිතුරෑවේය, මිත්‍රවෙයි, (එමෙන්) මිතුරෑනෑසීමට, මිත්‍රනෑසීමපිනිස, පසමිතුරෑ, අමිත්‍රයා, එක්වෙයි, එකතුවෙයි, නිවතුත්හට, වස්තු නැතතවුන්ට, නොහොත් නිවටයන්ට, මිතුරෑනෑකෙනෙක්, මිත්‍රකෙනෙක්, ඥාතිකෙනෙක්, කවුරෑ, කවුරුද—

33 සු ග ත් ව නෑසු සව්සතුනි නෑනව ත
අ න න් කිරීමට නොපසිනෙනි ඇහිනෑ ත
ඇනොහොත් මදක්ත් පරවෑඩවිත් එයි ත
ක අ ත් සැපත් නොවෙද මොක්පුර සැප ත

34 සුගත්වනෑසු, බුද්ධානඇසුවාවූ, නෑනවත, ඥානවත්තවූ, සව්සතුනි, සියළුසත්වයිනි, අනත්කිරීමට, අනාථකි

විඳපිනිස, නොපසිතෙහි, නොපගේසිත්හි, නැත, උත්සාහය, ඇත, ඇත්තේය, එසිත, ඒ(උත්සාහය) චිත්තය, පරවැඩව ත්, අනුත්ට වැඩපිනිසත්, මදක්වත්, ස්වල්පයක්වත්, ඇතො ත්, ඇත්තේනම්, මොක්පුරසැපත, නිවන්පුරසැපත, කඅ ත්සැපත් නොවේද, කාගේ හස්තප්‍රාප්ත නොවේද—

34 බලැති නවුත්හට බත්වෙරෙහි නොනැව ත
විප ත් පැමිණියත් ඉත්කිසි නිනානැ ත
මහත් විදුරැ ගිරිබිතකට වැදඅනු ත
සුහත් දලඇතුව ලොවැ අපහසක්නැ ත

34 මහත්, මහත්වූ, විදුරැගිරිබිතකට, විදුරැගල් භිත්තියකට, වැදඅනුන, වැදීඇත්තකල්හි, දලසුනත්, දත්සිඳුනනමුත්, ඇතුට, ඇතාට, ලොවැ, ලෝකයෙහි, අපහසක් නැත, අපහාසයක් නැත්තේය, (එමෙන්) නොනැවත, නොනැවති, බලැත්තවූත් හට, බලඇත්තාවූත්ට, බත්වෙරෙහි, බඳිනලදවෛරයෙහිදී, විපත්පැමිනියත්, විපත්තිපැමුනුනේනමුත්, ඉත්, එයින්, කිසි නිගානැත, කිසිනින්දාවක්නැත්තේය—

35 නපුරැ කලට සතහට පැමිණෙනවෙහෙ ස
එදුරැ නොවෙයි කලපව් පලදෙවාමී ස
තබුරැ වණය මුකුලිතවනබව සව ස
කවුරැ විසිත් වැලකියහැකි මෙදියකු ස

35 සවස, සවස්වේලෙහි, තඹුරැවණය, නෙළුම්වනය, මුකුලිතවනබව, හැකිලීම වනබව, මෙදියකුස, මේලෝක කුසෙහි, කවුරැවිසින්, කවුරුන්විසින්, වැලකියහැකි, වැලැක්වියහැකිවනු ලැබේද, නොලැබේමය, (එමෙන්) නපුරැ කලට, නපුරැකාලයට, සතහට, සත්ත්වයාහට, වෙහෙස, දුකිං ඝනයක්, පැමිණෙන, පැමිණිකල්හි, කලපව්, කරණලදපාපය, පලදෙවාමිස, විපාකදෙවාමිසක්, එ, ඒ වෙහෙසය, දුරැ නොවෙයි, දූරීභූතනොවෙයි—

36 ක ර දර දුදන පිරිසිඳැ දතුවදසන ර
ඝො ර තර සපුත් විලසිත්කව මිනිලක ර
න ර වර සඳුත්තුර වලඳිම්නි හැමව ර
ප ර නව විසමිශ්‍ර අමදෙති කවරව ර

36 කරදර, කෲරභාවයදරණ්නාවූ, දුදන, දුර්ජනයෝ, ශ කාර, ශාස්ත්‍රය, පිරිසිඳැ, නිස්චයකොට, දතුවද, දැනගත් තුමුත්, කාමිනිලකර, කණ්ඨවාංතිකෘයෙත් අලඞ්කාරවූ, ඝොරතර, ඝෝරතරවූ, සපුත්විලසින්, සර්පයෝමෙන්, නර වරසඳුත්තුර, රජනමැති සඳුත්වෘක්ෂය, වලඳිම්නි, වැලඳග නිම්න්, හැමවර, සැමකල්හි, පරනව, අත්‍යන්ත්ව, විෂමිශ් ර, විෂයක්මමිසක්, කවරවර, කවරකාලයක, අමදෙති, අ මෘතයක් දෙත්ද (නොදෙත්මය)—

37 උදක් සමිත් පිඹුළැපමනිජ් බැර ම
පසක් ලොහොම දැඅළුවෙයි වෙනවෙන ම
දුතක් පැමිනි ගුණවත් දනළැ සුසු ම
වගක් නසනු විසිතුරැකොට කියනුකි ම

37 උදක්, නනිතර, බැරම, බොහොකොටම, සමිත්, මයි නහමින්, පිඹුළැපමනින්, පිඹුළැවාවූ පමනකින්, පසක්ලො හොම, පංචලෝහයම, වෙනවෙනම, වෙන්වෙන්වම, දැ, දහනව, අළුවෙයි, භස්මවෙයි, (එමෙන්) දුතක්පැමිනි, දුත ක්පැමුනුනාවූ, ගුණවත්දන, ගුණවත්නජනයා, ළැසුසුව, ලනාලදසුස්මයවිසින්, වගක්නසනු, වගීයක් නසනබව, විසි තුරැකොට, විචිත්‍රකොට නොහොත් විස්තරකොට, කියනු කිම, කියනුමකිව්ද—

38 තුල සියදිවි පූරැදුවි විසුවත් නොම ද
දුල ගුණ සුදනන්ගෙ නොදනිති දනෝද ද
විල වැසිමැසිනු නොදනිති පියුමෙහි සුව ද
වල කිඟුළුමුවරද ගෙණැමත් වැදෙතිනු ද

38 නොමඳ, බොහෝසෙයින්, සියදිවිතුල, තමාගේ ජීවිතයමෙන්, පුරුදුව්, පුරුදුව, විසුමන්, වාසයකලත්, දද, මෝඩවූ, දනෝ, ජනයෝ, සුදනන්ගේ, සත්පුරුෂයන්ගේ, ගුලනුත, දීප්තිමත්ගුණය, නොදනිති, නොදනිත්ය, (ඒබව මෙසේයි) විලවැඩි, විලෙහිවැඩුනාවූ, මැඩිනු, මැඩියෝ, පියුමෙහි, පද්මයෙහි, සුවඳ, සුගන්ධය, නොදනිති, නොදනිත්ය, වල, වනයෙහි, බඹරු, භෘංගයෝ, එවුවරඳ, ඒමල්පැනි, රොණු, හැරගෙණ, මත්වැ, මත්වී, නදෑ, නාදය, දෙති, දෙත්ය—

39 කුරිරු නොර සපුත්ගේ දලගෙහි විසය
මදුරු මැසි කැලත්ගේ තුඩගෙහි විසය
රුදුරු තුනුසුවන් තැඹි වලගෙහි විසය
කපුරු දුදනත්ගෙ සියලගෙහිම විසය

39 කුරිරු, කෲරවූ, නොර, භයානකවූ, සපුත්ගේ, සර්පයන්ගේ, දලගෙහි, දලඅග, විසය, විසඇත්තේය, මදුරුමැසි කැලත්ගේ, මදුරුමැසි සමූහයන්ගේ, තුඩගෙහි, තුඩඅග, විසය, විසඇත්තේය, රුදුරු, රෞද්‍රවූ, තුනුසුවන්, තෝනුසුවත්ගේ, තැඹි, තැඹුනාවූ, වලගෙහි, වලිගයෙහි, විසය, විසඇත්තේය, කපුරුදුදනත්ගේ, කපුරුදුර්ජනයන්ගේ, (ඒසේනොවෙයි) සියලගෙහිම, සියළුසැරීරයෙහිම, විසය, විසඇත්තේය—

40 පර සිඳු පබ්ඳනත් සෙව්පමනිත් මන රූ
බෙලෙනිඳු මඳවුවත් නොකෙරෙහි රැපුන්ය රූ
බර නිඳු ගෙලෙ වසන නාරද ගැරිමිංග රූ
ගු රු ළි ඳු අගින් ඇසිකිම යහළු නොපතු රූ

40 බරනිඳු, ඊශ්වරයාගේ, ගෙලෙ, ග්‍රීවයෙහි, (බෙල්ලේ) වසන, වාසයකරන්නාවූ, නාරද, නාගරාජනෙම, ගැරුවෙමින්, ගර්විතවෙමින්, (ආඩම්බරවෙමින්) ගුරුළිඳුඅගින්, ගුරුළු

රජයාකෙරෙත්, යනඑ, මිත්‍රය, හොරතුරුකිම, හොරතුරුකි මැසි, ඇසී, ඇසුරෙවිය, (එමෙත්) මහරු, පූජ්‍යවූ, පරසිඳු, ප්‍ර සිඩවූ, පවුදනත්, ප්‍රධානජනයන්, සෙවිපමණින්, සේවන යකාල ප්‍රමාණයකින්, බෙලෙහිඳු, බලයෙත්ද, මදවූවත්, ම දිවූයේතුමුත්, රූපුත්, සතුරත්, සරුහොකෙරෙති, සැලකී ම නොකෙරෙත්ය—

41 සත තිත් පවත් අවකොල බුදිත තවස ර
දූහැනිත් මිදෙත් දුටලෙලදෙත ලියතඹ ර
බුදි මි ත් යමෙක් කිරි තෙල් දී රසඅහ ර
ඉ දු ර ත් දමන සිඳුඉපිලෙව් මඳරගි ර

41 සතතින්, තිරන්තරයෙන්, පවන්, සුලඟින්, කොල, පතුයන්, අව, ආයේනම්, බුදින, අනුභවකරණ්ණාවූ, තව සර, තපෝචාරීහු, ලෙලදෙන, ලීලෝපේතවන්නාවූ, ලියතඹ ර, නාරිලතා පුෂ්පයන්, (සත්‍රිවිලාස මල්විශෙෂයෙක්) දුට, දර්ශනයකලහොත්, දූහැනිත්, ධ්‍යානයෙන්, මිදෙත්, පහ වෙත්, (එසේහෙයින්, යමෙක්, යම්කෙනෙක්, කිරිතෙල්දී, කිරිද තෙල්ද දීකිරිද සහිතවූ, රසඅහර, රසආහාරයන්, බුදිමි න්, අනුභවකරමින්, ඉඳුරන්, ඉන්ද්‍රියයන්, දමන, දමණයක ලොත්, (එය) මඳරගිර, මහමේරුව, සිඳු, සමුද්‍රයෙනි, ඉපිලිඑ ව්, ඉල්පුනාක්මෙනි—

42 කු සඔත සියසොහොවූරුවූවද තමහ ට
හිතතැත යෙහෙ දුරුකල පොකුරඹ ලෙස ට
තම ග ත වාපිත්සෙම් කිපෙනුය මර ට
වණ ග ත ඔසුවගනිතවෙයි සුවපත ට

42 තමගත, තමාගේ ශරීරසම්බන්ධිවූ, වාපිත්සෙම්, වා ත පිත්ත ශ්ලේෂ්මාවෝ, මරට, මරණයපිණිස, කිපෙනුය, කි පෙන්නාහුය, සුවපතට, සුවපත්විමට, වණගතඔසුවග, ව්‍රණා න්තරගත ඖෂධවගී, හිත්වෙයි, හිත්වේය, (එසේහෙයින්)

කුසගත, කුසයෙහිගත්තාවූ, සියයොහොවූරුවූවද, තමාගේ සහෝදරයාවූවත්, තමහට, තමාට, හිතනැත, හිතනැත් තේනම්, පොකුරාඹලෙසට. නොඑම්පතෙහි දියක්මෙන්, දුරුකල, දුරුකලහොත්, යෙහෙ, යහපත—

43 ප ර සතුදෙයක් උදුරණලෙසට කරලො ල
වෙර දුදනයන් පැවසුනෙනක බොරුතෙපු ල
තිර සර මහතුන්ගෙ සිතැනොරඳයි නිම ල
සු ර තුරවිමණ වෙදරිටූනට කවරක ල

43 කවරකල, කවරකලෙක්හී, සුරතුර, දිව්‍යවෘක්‍ෂය, රිටූනාට, කපුටුවන්ට; විමනවේද, විමංනයවේද, (නොවේම ය) (එමෙන්) පරසතුදෙයක්, අනුන්සන්තකදෙයක්, උදුර ණ ලෙසට, උදුරාගන්නා ලෙසට, ලොල, ලෝභය, කරැ, කොට, වෙරදුදනයන්, වෛරීදුර්ජනයන්, පැවසූ, කීවාවූ, නෙකබොරුතෙපුල, අනේකබොරුවචන, තිරසර, ස්ථිර සාරවූ, මහතුන්ගේ, මහත්වයන්ගේ, නිමල, නිර්මලවූ, සිතැ, සිත්හී, නොරඳයි, නොරඳන්නේ (වේ) යි—

44 ස ත් ගුණයුත් සතන්හට වැඩකලොත්ස රු
අ ත් පිටදියුනුවම එමකෙරෙති නිරතු රු
ව ත් කලදිය තෙරඑ තුරු මුලට පියක් රු
දෙත් මුදුනයෙන් දරමින් රැගෙණැ අමයු රු

44 පියකරු, ප්‍රියකරවූ, තෙරඑතුරුමුලට, නාලිකේර, (පොල්) වෘක්‍ෂමූලයට, වත්කලදිය, වක්කරණලද ජලය, රැගෙණැ, හැරගෙන, මුදුනයෙන්, මුදුනෙන්, දරමින්, ධාරනයකරමින්, අමයුරු, අමෘතයක්සේ, දෙත්, දෙති, (එමෙන්) සරු, සාරවූ, සත්ගුණයුත්, යහපත්ගුනයෙන් යුක්තවූ, සතන්හට, සත්වයන්ට, වැඩකලොත්, වැඩකලහොත්, එම, එයම, නිරතුරු, නිරන්තරයෙන්, අත්පිට, ඉදිරිපිට, දියුනුවම, දෙගුනයක්ම, කෙරෙති, කෙරෙත්ය—

45 නැනගි දනන්හට මඳගුණයක් කල ද
පවති ගලැකෙටූ අකුරක්මෙන් නිබ ද
විමති දනන්හට කලකිසි ගුණතොම ද
එ නැති වේය දියපිටඇඳි ඉරක්ලෙ ද

45 නැනගිදනන්හට, ඥානවන්ත ජනයන්ට, මඳගුණයක්, ස්වල්පගුණයක්, කලද, කලනොත්, ගලැකෙටූ, ගලෙහිකොටූවාවූ, අකුරක්මෙන්, අක්ෂරයක්මෙන්, නිබඳ, නිරන්තරයෙන්, පවති, පවතිය, විමතිදනන්හට, අඥානජනයන්ට, තොමද, බොහෝවූ, කිසිගුණ, කිසිගුණයක්, කල, කලනොත්, ඒ, එය, දියපිට, ජලමතුයෙහි, ඇඳි, ඇන්දාවූ, ඉරක්ලෙද, රේඛාවක්මෙන්, නැතිවේය, නැත්වෙයි—

46 අමිත ගුණ නුවනයුතු උතුමෝ පබ ද
අනත වෙහෙස ලදුවත් නොමවෙති දුන ද
දිගන පතල සුවඳැති සොඳ සඳුන්ක ද
සිඳිත ඡිඩිත එකලෙස පැහිරෙයි සුව ද

46 දිගනපතල, දිගාන්තරයෙහි පතලාවූ, සුවඳැති, සුවඳ ඇත්තාවූ, සොඳ, යහපත්වූ, සඳුන්කඳ, හඳුන්කඳ, සිඳිත, කපනකල්හිද, ඡිඩිත, පොඩිකරණකල්හිද, එකලෙස, ඒකාකාරයෙන්, සුවඳ, සුගන්ධය, පැහිරෙයි, පැතිරියෙයි (එමෙන්) අමිත, අප්‍රමාණවූ, ගුණනුවනයුතු, ගුණයෙන්ඥානයෙන්යුක්තවූ, පබඳ, ප්‍රබන්ධවූ, උතුමෝ, උත්තමයෝ, අනතවෙහෙස ලදුවත්, අනන්තවෙහෙස ලදනමුත්, දුනද නොමවෙති, දුෂ්ටසිත්ඇත්තානු නොවෙත්ය—

47 බුදුන් දහම් සඟනට නොකලෙම් අද ර
නිවන් දකිණ පිණකුත් නොකලෙම් පව ර
ලියන් තනා නොසිපියෙම් සිහිනෙන් විත ර
උපන් නෙමයොවූන්වණයට පොරවසු ර

47. බුදුන්දහම්සඟනට, බුද්ධධර්ම සංඝයන්ට, අදර, ආදර

ස, නොකලෙළී, නොකලෙළිය, පවර, උතුම්වූ, නිවත්දකී
නා, නිවත්දූකීමට නිසිවූ, පිණාතුත්, පූර්ණයනුත්, නොක
ලෙළි, නොකලෙළිය, ප්‍රියන්තන, ස්ත්‍රීන්ගේ පයෝධරයත්,
සිහිනෙත්විත ා, සිහිනෙත්පමනවත්, නොසිඳෙයම්, වැල
ද නොගන්නෙමි, (එසේකල) මයොවූත්වර්‍ණය ා, මවගේ
යෞවනය නමැති වර්‍ණයට, පොරවනු ා, පොරවක්සේ, උප
න්නෙන, උපන්කෙනෙක් (වේමි) යනු—

48 නොමදත් සනෙක් ගැඹිරිත්පුත් පදසත ර
ප ද රු ත් වියකම්යි සලකණු සබයතු ර
ම ද ම ත් තුගු මහත් වණගිජ්දෙකු ලන ර
සි ය ප ත් නලහුසිත් බඳිනෙව් කාරණවැ ර

48 ගැඹිරින්පුත්, ගම්භීරයෙන්යුක්තවූ, පදසතර, පද්‍ය ශාස්ත්‍රය නොහොත් නාමය ක්‍රියාය උපසර්ගය නිපාතය ය න සතරපදය, නොමදත්, නොදත්තාවූ, සනෙක්, සත්ව යෙකුවිසින්, සබයතුර, සභාවඅතරෙහි, පදරුත්, පදඅර්ථ යත්, වියකම්යි, කියම්යි, සලකනු, කල්පනාකිරීම (කෙබඳු ද), මදමත්, මදයෙන්මත්වූ, තුඟු, උස්වූ, මහත්, මහත්වූ, ලතර, සිත්දූෂිවූ, වණගිජ්දෙකු, වණහස්තිරාජයකු, සියපත් නලහුසිත්, නෙළුම්දණ්ඩෙහි නූලෙන්, බඳිනු, බැඳීමට, වෑ රකාරණඑව්, වියදීකරණ්ණාක්මෙනි—

49 කොනෙක් ගුණනලත් දුදනත්හට අසු බ
අ ක ක් පමණවත් නොගෙනරෙහි පිරියලො බ
එ උ ක් රසෙනි සැදුවත් නිඹිඹ්ජු කිර ඹ
උ ද ක් තික්තමය ගැබ්පසතුරෙහි නි ඹ

49 එළක්රසෙනි, ඒළුක්රසයෙනි, කිරඹ, කිරිවතුරෙන්, නිඹිඹ්ජු, කොසඹඇටය, සැදුවත්, සැදූනුමුත් හෙවත් පැල කළනුමුත්, නිඹතුරෙහි, කොසඹගසෙහි, ගැබපස, ඇතුළ්

පාර්ශ්වය, උදක්තිත්තමය, තනිකර හිත්තමය, (එමෙන්) අසුබ, අයහපත්වූ, දුදනත්හව, දුර්ජනයත්ව, නොනෙක් ගුණකලත්, නොපමනගුනකල නුමුත්, අකත්පමනවත්, ම ද්‍රවිය දෙකහමාරක් පමනවත්, පිරියලොබ, ප්‍රිතිලෝභයක්, නොකෙරෙති, නොකෙරෙත්ය—

50 ස ඳු න් කපුරු සමගින් පිණිදිය නොම ද
සොඳින් කලල්කෙරෙමින් සුවඳ මුවම ද
නි තී න් තිමිඹ ඉසැ ඉසැ * එහුනු වැව්ව ද
ත ම න් ගුණය නොහරිණිවැනි දුදනහ ද

50 දුදන, දුර්ජනයාගේ; හද, හෘදය (කෙසේද), නොමද, බොහෝවූ, පිණිදිය සමගින්, පිණිදියර සමග, සඳුන් කපුරු, සඳුන්ද කපුරුද, සුවඳමුවමද, සුවඳඇත්තාවූ කස්තුරිද, සොඳින්, යහපත්ලෙසින්, කලල්කෙරෙමින්, මඩකරමින්, නිතින්, නිරන්තරයෙන්, තිමඹ, පිනිදිය, ඉසැඉසැ, ඉහීමකොටකොට, එහුනු, එැනු, වැව්වද, වැවූනුමුත්, තමන්, තමන්ගේ, ගුණය, ඇත්තාවූගුණය, නොහරිනවැනි, නොහරින්නාක්මෙනි—

51 ස ම ගි ණ දුදනසහ සහවණු බඳිනුවෙ ර
නොයෙදෙණ කරුණුමය සුදනත්හවපව ර
ගි ණිගෙ ණැ දිලි අඟුරුගත්කලැ දවයිකා ර
නි වි තැ ණැ රැගත්හොත් කළුවේය නොවිත ර

51 දුදනසහ සමගිණ, දුර්ජනසත්වයාසමගින්, සහවණු, සහවීමද, වෙරබඳිනු, වෛරබැඳීමද, පවර, උතුම්වූ, සුදනත්හව, සත්පුරුෂයත්ව, නොයෙදෙන කරුණුමය, නොයෙදියයුතු කාරණාමය, නොවත් නුසුදුසු කාරණාමය, ගිණි

* සමහර පොතෙක්හි, එනුවැවූවද කියාතිබෙයි. එහි, එණුනම්, ලවනයයි—

ගෙණැදිලි, ගිනිගෙණ දිලිහෙන්නාවූ, අඟුරුගත්කලැ, අ
ඟුරුගත්කල්හී, කාරදවයි, අනදවයි, නිවිනැතැ, නිවුනකල්
හී, රැගත්තොත්, හැරගතහොත්, නොවිතර, බොහෝසේ,
කළුවේය, කළුවෙයි—

52 පතර දුදන අනදර සුදන අදර ද
අවර දිනිඳුශේලෙස වැඩිවෙයි නිබ ඳ
අදර අනාදරද පිලිවෙල නොවත්හ ද
ලහිර සේ වැත්න අඩුවන මදිත්ම ද

52 පතර, මහත්වූ, දුදන, දුර්ජනයාගේ, අනදර, අනාදරයද, සුදන, සත්පුරුෂයාගේ, අදරද, ආදරයද, අවර දිනිඳුසේලෙස, අවරමගිය සූර්‍ය්‍යාඇතිකල්හිඡායාවමෙන්, නිබඳ, නිරන්තරයෙන්, වැඩිවෙයි, වැඩිමවෙයි, පිලිවෙල, පිලිවෙලින්, (ඒනම් දුර්ජනයන්ගේහා සත්පුරුෂයන්ගේ) හඳනොවත්, හෘදයෙනි නොවත්නාවූ, අදරඅනදරද, ආදරය සහ අනාදරයද, මදිත්මද, මඳමදින්, අඩුවන, අඩුවන්නාවූ, ලහිරශේවැනන, බාලසූර්‍ය්‍යා ඇතිකල්හී ඡායාවමෙනි.

53 න ම ත් හට නොසමයන්වණ කලටස ම
මු වෙ ත් නොබැනැ ඉවසනු සුදන ගරුක ම
නොමිත් කුමුදුවණ විකසිතවනු දැකැ ම
වි ලි ත් මෙත් තඹුරු මුකුලිනවේය හැ ම

53 කුමුදුවණ, කුමුදවනය, නොමිත්, බොහෝසෙයින්, විකසිතවණු, පුබුදුවීම, දැකැම, දකිනයකොටම, විලිත්මෙන්, ලජ්ජාවෙත්මෙන්, තඹුරුහැම, නෙළුම්මල් සියල්ල, මුකුලිනවේය, හැකිලෙයි, (එමෙන්) ,තමත්හට, තමන්ට, නොසමයන්, සමනුවූවන්, සමවණකලට, සමාණවණකල්හි, සුදන්, සත්පුරුෂයාවිසින්, මුවෙන්, මුඛයෙන්, නොබැණැ, කථානොකොට, ඉවසනු, ඉවසනබව, ගරුකම, ගරුකමෙකි—

54 මිනිස් භව සොඳුරැ ගුණසත නුගුණ ඇතැ න
තිදෙස් කෙනෙතක් මෙදිගත උපදතේතැ න
වෙසෙස් සිනිඳු මුවාදඹර සහස්ප ත
කොරෙස් තලින් යුතුවෙයි කටුපෙල දිමු ත

54 වෙසෙස්, විශිෂ්ටවූ, සිනිඳු, සිනිඳුවූ, මුවාදඹර, මකරඳයෙන්, (මල්පැණියෙන්) හාවූ, සහස්පත, නෙළුම්මල, කටුපෙලදිමුත, කටුපෙලින් දිලිහෙන්නාවූ, කොරෙස් තලින්, කොරසැඩි දත්ඩකින්, යුතුවෙයි, යුක්තවෙය්, (එමෙන්) මිනිස්නා, මනුෂ්‍යභාව, සොඳුරැගුණසත, යහපත්ගුණ සහ, නුගුණ, අගුණයද, ඇත, ඇත්තේය, තිදෙස් කෙණෙක්, තිදේවසකෙනෙක්, මෙදිගත, මෙලෝකයෙහි, උපදතේතැත, උපදිනුයේ නැත්තේය——

55 සිත මිත් උඩගුබව සතෙකුව නමකෙරෙ හී
සැපතිත් ඉදිමි සලකා නොකළුක් විදි හී
පත මින් දිවිරැකුම් රණමැදවැදූ නැසෙ හී
එබැවින් සෙබළුවැනි දදදත වෙනිත්තැ හී

55 උඩගුබව, උඩගුභාවය, සිතමින්, චිත්තනයකරමින්, සතෙකුව, සත්වයෙකුව, නමකෙරෙහි, නමස්කාරකෙරේය, සැපතිත්ඉදිමි, සැපයෙන්ඉදිමීයි, සලකා, කල්පනාකොට, නොකළුත්, නොනායෙන්ලුත්, විදිති, විඳිත්ය, දිවිරැකුම්, ජීවිතරක්ෂාව, පතමින්, ප්‍රාර්ථනාකෙරෙමින්, රණමැදවැදූ, යුද්ධමධ්‍යයටවැදී, නැසෙහි, නැසෙත්ය, එබැවින්, එසේහෙයින්, සෙබළුවැනි, ස්වභාවයන්වැනිවූ, දද දත, අඥානජනයෝ, වෙනිත්තැහි, වෙනිත්තැත්තාහුය.

56 කුලයෙත් නුණුදතෝ මහතුන් සෙවුත්කො ව
ඉසුරෙත් පුතුවැ පැමිණෙත් ගරුතනතුර ව
වෙසෙස සිත් කුසුම් ගෙතුමෙත් සුමුසුරඹප ව
සතොසින් සැපත්වෙයි කිරිඳුත් මුදුනත ව

56 වෙගෙසින්, විශේෂයෙන් කුසුම්නෙතුමෙන්, මල්ගෙහිමෙන්, සුමුසු, ගනපත්ගේ මිශ්‍රවූ, රඹාව, කෙසෙල්පට්ට ය, නිරිඳුන්, රජුන්ගේ, මුදුනතාව, හිසව, සතොසින්, සත් තෝෂයෙන්, සැපත්වෙයි, පැමිනෙයි, (එමෙන්) කුලයෙ න්හුනු, වංශයෙන් අඩුවූ, දනෝ, ජනයෝ, මනතුන්, මන ත්මයන්, සෙවුන්කොට, සේවණයකොට, ඉසුරෙන්, ඓ ස්වර්‍යයෙන්, යුතුවැ, යුක්තව, ගරුතනතුරව, ගරුකටයු තු ස්ථානාන්තරයට, පැමිනෙත්, ප්‍රාප්තවෙත්ය—

57 ප බ ඳ පබුද කිවිඳුද සුදෙගි සෙබළි ද
පැහැද සුරගි කෙළිණාවර වරඟණ ද
කිවි ද නෝනායනබස් පෙරදූරි දුන ද
වර ද නොවැ අසත් නිරිඳෝ වඩම්නො ද

57 පබඳ, ප්‍රසිධවූ, පබුද, ප්‍රබානීන්ද, කිවිඳුද, කවීන්ද්‍ර යන්ද, සුදෙගි, සුද්ධයෙනි, සෙබළිද, ස්වාභාවයන්ද, පැහැද, ප්‍රසන්නව, සුරගිකෙළිණාවර, සුරතික්‍රීඩාකරණකල්හී, ව රඟණද, වරාඞ්ගනාවන්ද, දුනදපෙරදූරි, දූෂ්‍යසිත් පෙරදූරි ව, නොනායනබස්, නෝය නාය යන වචන, කිවද, කිවිනා මුත්, නිරිඳෝ, නරේන්ද්‍රයෝ, වරදනොවැ, විරුද්ධනොව, නොවත් වරදනැයි කල්පනානොකොට, ඔදවඩමින්; යන් තෝස්වඩමින්, අසත්, අසනි—

58 සුදන ගුණෙන් යුතු උතුමන්ගෙ පිසක රු
අබ් ම න කි ත් වූරෙස නොකලහැකිදු රු
සිහිල ගු ණෙ න් යුතු දියදහර පිවිතු රු
මි ටි ම ග කි න් යනකලැ නාවතගී කවු රු

58 පිවිතුරු, පවිත්‍රවූ, සිහිලගුණෙන්යුතු, සීතලගුණයෙන් යුක්තවූ, දියදහර, ජලධාරාව, මිටිමගකින්, මිටිවූමාගීයකින්,

යනකලෑ, යනකල්හි, කවුරු, කවරතැනැත්තනු, නවත ති, නවතන්ද, (නැවැත්විය නොහැකිවෙත්) (එමෙන්) සුදනගුණෙන්සුතු, සත්පු[රු]ෂගුණයෙන් යුක්තවූ, පියකරු, ප්‍රියකරවූ, උතුමන්ගෙ, උත්තමයන්ගේ, අඩිමනකින්, කිසි කැමැත්තකින්, වූරෙස, වූවාවූරෙසය, දුරුනොකලහැකි, දුරුකල නොහැක්කේයි.

59 සුර පු ර සැපසපයන පින් නොමකෙරෙ හී
අර න ර අව[ඩ්‍ය]දෙන පවිම කරල හී
පැණසර නු ලොවැ නරයන්ගේ සිරි නී
කිරි හැර මර එළවණ ඝොර විසමබො හී

59 සුරපුරසැප, දිව්‍යපුර සම්පත්තිය, සපයන, ලබාදෙන්නාවූ, පින්, පුණ්‍යය, නොමකෙරෙහි, නොකෙරෙත්ය, අරනර, අධිකනරවූ, අවඩ්‍ය, අපායගිනිය, දෙන, දෙනනාවූ පවිම, පාපයම, කරලහි, කරලත්ය, ලොවැ, ලෝකයෙහි, පැණසරනු, ප්‍රඥසාරනුවූ, නරයන්ගේ, මනුෂ්‍යයන්ගේ, සිරිනි, චාරිත්‍රයකි, කිරිහැර, කිරිඅත්හැර, ම[ළ]එළවණ, මරණය පමුනුවන් නාවූ, ඝොරවිසම, ඝෝර විෂම, බොහි, බොත්ය.

60 ලො වි න් එකෙක් එකදේකට වේසම තා
වෙ නි න් අනික්දේ[ක]ට අනිකෙක් සම තා
නොම්න් සුලබ ලදු න් නදගිම් සැප තා
ගො සි න් නැව දෙ[...] රතයද නොයනුයු තා

60 ලොවින්, ලෝ[ක]යෙන්, එකෙක්. එක්තැනැත්තෙක්, එකදේකට, එකම්දෙය[කට], සමනවේ, සමවීවෙයි, අනිකෙක්, අනික් තැනැත්තෙක්, වේනින් අනික්දේකට, වෙනින්අන්‍යදෙයකට, ස[ම]න, සමවීය, (කෙසේද) නොම්න්,

බොහෝසෙයින්, සුලභ, වාතය, ලදුවත්, ලද්දේවීනමුත්, තදගිම්, තදග්‍රීස්මය, සැපත, සම්ප්‍රාප්තවූයේනමුත්, ගොඩින්නැව, ගොඩින්නැවද, දීයෙත්ංතයද, ජලයෙන් රථය ද, නොයනුයුත, නොයත්නාක්මෙනි ~

61 මු දු ව ට සිනිදු වෙඩරුද සුදනන් හද ද
සරිකොට කිවත් කිවිදන, නොමවෙයි එලෙ ද
ප ර ණ ම තැවුල්වන උනුවෙයි සුදනහ ද
එ ලෙ සට උනුනොවෙයි එබැවින් වෙඩරුන ද

61 මුදුවට, මෘදුවපවත්නාවූ, සිනිඳු, සිනිඳුවූ, වෙඩරුද, වෙඩරුද, සුදනන්හදද, සත්පුරුෂයන්ගේ හෘදයද, කිවිදන, කවිජනයාවිසින්, සරිකොට, සදෘශකොට, කිවත්, කීයනල්දනුමුත්, එලෙදනොමවෙයි, එලෙස නොවෙයි, පරනව, අනන්‍යත්ව, තැවුල්වන, තැවිමක්වූ කල්හී, සුදන හද, සත්පුරුෂයන්ගේ හෘදය, උනුවෙයි, උණුවේය, එලෙසට, ඒආකාරසට, උනුනොවෙයි, (වෙඩරු) උනුනොවේය, එබැවින්, එහෙයින්, වෙඩරුහද, වෙඩරුදී ~

62 නොහිම් සුවඳ විහිදෙන කස්තුරිනිම ල
උ තු ම් මුව නැබෙහි තිබ්බඹ නැනවිකා ල
චි න ම් මෙමට මහබඹුපද වියවිකා ල
න බ ම් බොරුකියන දුදනන්ගෙ දිවමු ල

62 නොහිම්, ඉමක්නැත්නාවූ, සුවඳවිහිදෙන, සුගන්ධය විහිදෙන්නාවූ, නිමල, නිර්මලවූ, කස්තුරි, කස්තුරිය, බඹා බ්‍රහ්මතෙම, නැනවිකල, ඥානවිකලයෙන්, උතුම්, උත්තමවූ, මුව, මුවන්ගේ, නැබෙහි, නාභියෙහි, තිබ්, තිබීය, මෙමට, මෙමට, මහබඹුපදවි, මහාබ්‍රහ්මතනතුර, යම්කල, යම්කාලයෙක්හි, වීනම්, වූයේනම්, බොරුකියන, බොරුකී

යක්තාවූ, දුදනන්ගෙ, දුර්ජනයන්ගේ, දිවමුල, දිවමුලෙහි, තබම්, තබම් —

63 අ බ ර ණ සමඟ සිටිපිරිවරද නමවෙ න
නොදරණ තැනැ යෙදුවහොත් නොමවේ දිමු න
කොපමණ රජ්ජුසුරු ලදුවත් මුළුදිය න
සි ළු මි ණ සරණ බඳහොත් අපහසකර න

93 මුළුදියත, සියළුලෝකයෙහි, රජ්ජුසුරු, රාජෛශ්වර්යය, කොපමණ, කොතෙක්ප්‍රමානා, ලදුවත්, ලදනුමුත්, සිළුමිත, සිඛාමාණික්‍යය, සරණ, චරණයෙහි, (පයේ) බඳහොත්, බන්ධනයකලහොත්, අපහසකරත, අපහාස්‍යකරත්ය, (එමෙන්) නමවෙත, නමත්සම්පයෙහි; අබරණසමඟ, ආභරණසහිතව, සිටි, සිටියාවූ, පිරිවරද, පිරිවරජනයාද, නොදරණතැනැ, දරානොසිටිනතන්හි හෙවත් දැරියනොහැකිතනතුරෙහි, යෙදුවහොත්, යෙදුයේනම්, දිමුනනොමවේ, දිප්තිමත්නොවෙයි, —

64 නොවිතර නෙදබලැති මහතුත්හව පව ර
වැ ර සැර මඳනුවණ මඳත බඳිනුවෙ ර
තු ඟු ත ර ගිරිපුලත දලදලශිත් පැහැ ර-
ම ත ව ර නිදුව පෙදෙ නැතැ වෙහෙසෙන අයු ර

64 නොවිතර, අප්‍රමානවූ, නෙදබලැති, තේජබලඇත්තාවූ, පවර, උතුම්වූ, මහතුම්හව, මහත්මයත්ව, වැරසැර මඳ, වීරසාරමදිවූ, නුවණමද, ඥානයමදිවූ, දන, ජනයා විසින්, වෙර, වෛරය, බඳිනු, බැඳීම, කෙසේද, තුඟු, උස්වූ, තර, මහත්වූ, ගිරි, පර්වතයන්, දලදලගින්, මහත්වූ දත් අගින්, පැහැර, ප්‍රහාරණයකොට, උපුලත, උදුරණ්ණාවූ, මතවරණිදුව, මත්තහස්තිරාජයාව, පෙදෙන්, පාදයෙන්, ඇ

නෑ, ප්‍රහාරණයකොට හෙවත් ඇනලා, වෙනෙසෙනඅපුර, මෙයෙන්නාත්මෙනි—

65 නිරසර ගුණෙන්යුතු උතුමෙතුහට පව ර
සමුදුර සියල්තිඳලක තුඹසෙක සුනෙ ර
පුවතර මෙදඹදිව මළුවෙක සියගෙද ර
ඔහුකර නොවන සැපතෙක් එබැවින් කව ර

65 පවර, උතුම්වූ, නිරසරගුණෙන්, ස්ථිරසාරගුණයෙන් යුක්තවූ, උතුමෙකුහට, උත්තමයෙකුට, සියල්සමුදුර, සියළු සමුද්‍රය, තිඳලෙක, තිඳලියක්ය, සුනෙර, මහාමේරුව, තුඹසෙක, තුඹසෙක්ය, පුවතර, ප්‍රසිද්ධවූ, මෙදඹදිව, මේජම්බුද්වීපය, සියගෙදර, තමාගේගෙදර, මළුවෙක, මළුවක්ය, හෙවත් මිදුලක්ය, එබැවින්, එසේහෙයින්, ඔහුකරනොවණ, ඔහුඅයින්නොවන්නාවූ, සැපතෙක්, සම්පත්තියෙක්, කවර, කවරේද—

66 නොපණත් අය අනන අහසෙවිනා නියම
එමහත් බැවින් වනසනු නොයදෙත් සැවොම
තමසිත් තුලෙහි වෙර නැසුවොත් නොතබා ම
වැණසෙත් ඔවුන් හැමදියවත් ගිනිසේ ම

66 නොපණත්අය, පනතටවිරුඬව හැසිරෙන්නාහු, අනනඅහසෙව්, කෙලවරක්නැති ආකාසයමෙන්, නියමනැත, නියමයක්නැත, එමහත්බැවින්, ඔවුන් මහත්බැවින්, සැවොම, සියල්ලෝම, වණසනු, විණාසකරනු ලැබීමට, නොයෙදෙත්, නොවියෙදෙත්ස,(එසේහෙයින්) තමසිත්තු ලෙහි, තමාගේ සිතඅතරෙහි, වෙර, වෛරය, නොතබාම, තැබීම නොකොටම, නැසුවොත්, විනාසකලහොත්, ඔවුන්හැම, ඔවුන්සියල්ලෝම, දියවත්, ජලයපැමුනුනාවූ, ගි

ජීසේම, ගිනිලෙසවම, වැණසෙත්, විණාසවෙත්ය—

67 වණක ල සතු න්හට සිරිසැපත මණක ල
කස පල තුලෙති දියලොඳමෙත් වෙයිවිපු ල
ඝන කල එසිරිසම්පත් වැනසෙයි සිය ල
ගජ හ ල ඇතුලැ ඔදසුත් දිවුල පලතු ල

67 සතුන්හට, සත්වයන්ට, මණකල, යහපත්වූ, සිරිසැපත, ශ්‍රීසම්පත්තිය, වණකල, වන්නාවූකල්හි, කසපලතුලෙයි, කසපලය ඇතුලෙහි, දියලොඳමෙන්, වතුරහාලොඳමෙන්, විපුලවෙයි, මහත්වෙයි, එසිරිසම්පත්, ඒශ්‍රීසම්පත්තිය, ඝනකල, යන්නාවූකල්හි, සියල, සියල්ල, වැණසෙයි, විණාසවෙයි, (කෙසේද) ගජගල, හස්තියාවිසින් ගිලිණලද, ඇතුලැ, ඇතුලෙහි, ඔදසුත්, ඕජස්සුනාවූ, දිවුලපලතුල, දිවුල්ගෙඩිවැනිය—

68 ම හ ත් දනවතුත් ඇ තිවද සුදනගෙ ණ
ග නිත් තමන් කටයුතු නිරිඳෝ නිති ණ
ඇතත් කෙලගණන් රැස්කල දන නොමි ණ
බල ත් ලොභොදපනතල ගෙණැ තමඋව ණ

68 මහත් දනවතුත්, මහත්වූ ධනවන්තයන්, ඇතිවද, ඇතිනමුත්, සුදනගෙණ, සත්පුරුෂයන්ගෙන්, නිරිඳෝ, නරේන්ද්‍රයෝ, නිතින, නිරන්තරයෙන්, තමන්කටයුතු, තමන්ගේ කටයුතුදෙය, ගණීත් (කර) ගනිත්ය; (කෙසේද) නොමිණ, බොහෝසෙයින්, රැස්කල, රාසිකලාවූ, කෙලගණන්, කෝටිගණනින්යුක්තවූ, දන, ධනය, ඇතත්, ඇතිනමුත්, ලොභොදපණතල, ලෝභකෑඩපත, ගෙණැ, ගැරගෙණ, තමඋවණ, තමන්ගේ මුහුන, බලත්, බලත්ය, (ඊමෙනි)—

69 මදයෙන් මත් මතඟ කුඹුතල පිරිමඩිති
විසයෙන් දැඩිඋරග උරතලෙහි පලඳිති
මෙලෙසින් අසිරිමත් විසිතුරු සතකෙරෙති
එමදින් රජුන්මත් සේවයකරැ රැකෙති

69 මදයෙන්මත්, මදයෙන්මත්වූ, මතඟ. හස්තීන්ගේ, කුඹුතල, කුම්භස්ථලය, පිරිමඩිති, පිරිමඩිත්ය, විසයෙන්, විශයකාරණකොටගෙණ, දැඩි, දැඩිවූ, උරග, සර්පයන්, උරැතලෙහි, උරස්ථලයෙහි, පලඳිති, පලඳිත්ය, මෙලෙසින්, මෙආකාරයෙන්, අසිරිමත්, ආශ්චර්යශ්‍රීමත්වූ, විසිතුරු, විචිත්‍රයන්, සත, සත්වයෝ, කෙරෙති, කෙරෙත්ය, එමදින්, ඒමදිව, රජුන්මත්, රජවරුන්මත්, සේවයකරැ, සේවයකොට, රැකෙති, රක්ෂාවෙති—

70 විහිදු තුරුසෙනඟ පිරිවර යුතුනොමිණ
සිනිදු අමාකිරණින් ලොවබබුළුවණ
නරිඳු දිනිඳුහමුවත නොදිලෙන බැවිණ
කෙබඳු කෙනෙක් එහුනොමවෙති අන්වදණ

70 විහිදු, පැතුරුණාවූ, තුරුසෙනඟපිරිවර, තාරකා පිරිවර සේනාවෙන්, යුතු, යුක්තවූ, සිනිඳු, සිනිඳුවූ, අමාකිරණින්, අමෘතරශ්මියෙන්, ලොව, ලෝකය, බබුළුවණ, බබලන්නාවූ, නරිඳු, චන්ද්‍රයා, දිනිඳුහමුවත, සූර්‍ය්‍යාභිමුඛවූ කාල්හි; නොදිලෙනබැවින, නොදිලිහෙන බැවින්, කෙබඳු කෙනෙක්, කොයිආකාර කෙනෙක්නම්, අන්වදන, අන්‍ය වචනයෙහි, හෙවත් අනුන්ගේ භාෂාවෙහි, එහුනොමවෙහි, සැහැල්ළු නොවෙත්ද, (සැහැල්ළුවෙත්මය)—

71 කළුන් මද්ද සබඅබතුරැ බොහොසෙති
ලෙසින් විදුලි දිලිහගපත් ලෙලකෙරෙති
කගින් කගපහර වැදූනැඟි පුළිඟුඇති
සමත් බිමැකගත් සෙබලෝ දුලබවෙති

71 කළුත්, ස්ත්‍රීන්ගේ, මද්‍ද, මධ්‍යයෙහිද, සපඅබිතුරැ, සභාඅනතරෙහිද, නිති, නිරන්තරයෙන්, බොහොසේ, බොහෝසෙයින්, විදුලිලෙසින්, විදුලිමෙන්, දිලි, දිලිහෙන්නාවූ, කගපත්, කාඩිගපත්‍ර, ලෙලකෙරෙහි, ලීලෝපේතකෙරෙත්ය, කගින්කග, කඩුවෙන් කඩුවෙහි, පහර, ප්‍රහාරය, වැදූ, වැදී, නාගී, නැංනාවූ පුලිඟුඇති, ගිනිපුපුරු ඇත්තාවූ, සවත්බිමැ, යුධභූමියෙහි, කගත්, කඩුගත්තාවූ, සෙබලෝ, සේවාභටයෝ, දුලබවෙහි, දුල්ලභවෙත්ය—

72 මෙලොවින් පරලොවින් වණ අවැඩ නොමදූ　　නා
සිරිතින් ලොවැ පැවති නැනවඳබල දුද　　නා
දෙකුලෙන් යුතුවැ උපනත් සකකිරිලෙසි　　නා
කුසුමින් උපන් පණුවැනි පෙරකල පවි　　නා

72 මෙලොවින්, මෙලෝකයෙහු, පරලොවින්, පරලෝකයෙහු, වණ, වන්නාවූ, අවැඩ, අනාභිවෘඩිය, නොමදූනා, නොදූනා, ලොවැ, ලෝකයෙහි, සිරිතින්, චාරිත්‍රයෙන්, නෙවත් පුරුද්දෙන්, පැවති, ප්‍රවෘර්තිනවූ, නැනවඳ, නුවනවඳවූ, බල, බාලවූ, දුදනා, දුර්ජනයෝ, සකකිරිලෙසින, හාබක්ෂරයමෙන් (හක්ගෙඩියෙහි වක්කරණලද කිරිමෙන්) දෙකුලෙන්, මව්පියදෙකුලයෙන්, යුතුවැ, යුක්තව, උපනත්, උපන්නවුත්, පෙරකලපවින, පූර්වයෙහිකරණලදපාපයනිසා, කුසුමින්, මලින්; උපන්, උපන්නාවූ, පණුවැනි, පනුවෝමෙනි—

73 නෙකවන් ඇතත් මෙතෙකැයියනා පමණනැ　　ති
ලොබසිතින් වෙමින් ඉල්ලුණු දිලිදුන් සිරි　　හී
දලනෙතින් නියුතු මෙනෙසුරු පුවතර තෙදූ　　හී
ජරපතින් මහවී නොත්වාහනයෙන් සර　　තී

73 පුවතර, ප්‍රසිඩවූ, තෙදැති, තේජස් ඇත්තාවූ, දළු තෙන්නියුතු, නාළිකේත්‍රාකින් යුක්තවූ, මෙනෙසුරු, මහේශ්වරයෝ, ජරපත්, ජරාවටපැමිනියාවූ, මිනළු, වෑඩවූ, තොත්වාහනාදයත්, වෘෂභ වාහනයෙත්, සරනී, හැසිරෙත්ය, (එමෙත්) ගමනෙනැසියන, මෙතෙක්ය යන, පමණනැහි, ප්‍රමාණයක් නැත්නාවූ, නෙනවත්, නොමෙත්වස්තු, ඇතත්, ඇත්හේනමුත්, ලොබසිත්වෙමින්, ලෝභ සිත්ඇතිවෙමින්, ඉල්ලණු, ඉල්ලීම, දිළිඳුත් දුරිද්‍රයන්ගේ, සිරිති, චාරිත්‍රයෙකි—

74 සගොබණ මහතුත්වවත් නොමිඳ ගරුත ර
දින දීණ පූරුදුවිමෙත් කෙරෙති අනාද ර
නොමදිණ සුවඳ විහිදෙන සොඳ සඳුන්හ ර
හිමවණ වසන වැදිඅඟනෝ කෙරෙති ද ර

74 නොමදින, බොහෝසෙයින්, සුවඳ, සුගන්ධය, විහිදෙන, පැතිරෙත්නාවූ, සොඳ, යහපත්වූ, සඳුන්හර, චන්දන සාරය (සඳුන්අරටුව) හිමවණ, හිමාලවනයෙහි, වසන, වසන්නාවූ, වැදිඅඟණෝ, වැදිඅඞ්ගනාවෝ, දරකෙරෙති, දරකෙරෙත්ය, (එමෙත්) නොමිදගරුතර, ඉතාබොහෝ ගරුකලයුතුවූ, සගොබන, යහපත්කම්න්යුක්තවූ, මහතුත්වවත්, මහත්මයත්වතමුත්, දිනදීණ, දවස්පතා, පූරුදුවීමෙන්, පුරුවීම කරණකොටගෙණ, අනාදරකෙරෙති, අනාදරකෙරෙත්ය—

75 ව හිත් බහිත් බුලහිත් සිනළි සැපති නී
නිහිත් විදිනපහසිත් රසමුසුබිසි නී
කතුත් සින්ගනිම් සලෙළිය් යහුකෙවැ නී
දුලිත් සුළං බඳනාව නැත් කාරණෙව් නී

75 වහිත්, වස්ත්‍රයෙන්ද, බහිත්, ආහාරයෙන්ද, බුලහිත්,

ශීලතගෙඤ, සියළුසැපගිනි, සකලසම්පත්ශ්‍රීගෙඤ, නිති
ත්, නිරන්තරයෙන්, මුදින, මිදින්නාවූ, පහසිත්, ස්ඵී
යෙඤ, රසමුසුවෙසින්, රසමිශ්‍රවචනයෙඤ, කතුන්, කාන්තා
වක්ත්‍රයෙන්, සිග්‍රගනිම්, සිනායනිම්යි, සලෙළින්, සල්ලාලයන්,
යනු, යනබව, නොවැනී, නොසිතාකාරද, දූලින්, දූලකින්,
සුලං, සුලඟ, බඳිනා, බැඳීමපිනිස, නැත්තාරණමෙනි, උත්
සාහකාරණ්නාස්මෙනි ~

76 අ ම ර ස ව න් අඹරස බුදිමින් සිනි දූ
නිති නෙළුය න් පෙදෙසෙනි සරමින් සි දූ
එනපැහැයෙන් ඉඳිනත් කොවුලන්වබ දූ
නදපම නි න් දූතගනහැකි රවුන්ඉ දූ

76 සිනිදු, සිනිදුවූ, අමරසවන්, අමාරසවැනිවූ, අඹිරස, අඹරසය, බුදිමින්, අනුභවකරමින්, නිති, නිරන්තරයෙන්, පසිඳු, ප්‍රසිඬවූ, නෙළුයන් පෙදෙසෙනි, ගෘහෝද්‍යාන ප්‍රදේශයෙනි, සරමින්, හැසිරෙමින්, කොවුලන්වබඳු, කෝකිලයන්වැනිවූ, එනපැහැයෙන්, එනමවර්ණයෙන්, ඉඳිනත්, ඉඳිනනමුත්, නදපමණින් (කාරණලද) නාදයෙන්පමනක්, ඉදු (ඒකාන්තයෙන්) ඇඳනැයිම, රවුන්, කපුටුවන්, දූතගනහැකි, දූනගතහැක්කේසි ~

77 වි සු ව න් ද්‍රුදනසන සුදනන් රැගෙනැස රූ
නැනවන් රජතුමෝ දෙහි ඔවුනොව ඉසු රූ
වි ස යු න් ගොර උරගකටැරැදි මිනිමහ රූ
ස ල ස න් රුවන්කිරුලගරුවණව සොඳු රූ

77 විසයුත්, විෂයුක්තවූ, ගොර, භයානකවූ, උරග, සර්පයාගේ, කටැරැඳි, බොටුමෙනි රැඳුනාවූ, මහරු, මනෝඥවූ, මිනි, මානික්‍යය, රුවන්කිරුල, රත්නකිරීටයාගේ, සො

සූර, යහපත්වූ, අගරුවණව, අශ්‍රෙෂ්ඨ රත්නවවට, සලස
ත්, පමුණුවත්ය, (එමෙන්) දුදනසන, දුර්ජනයන් සමග,
විසුවත්, වාසයකළත්, සරු, සාරවූ, සුදනන්, සත්පුරුෂයන්,
රැගෙණ, හැරගෙණ, නැනවත්, ඥානවන්තවූ, රජතු
මෝ, රාජෝත්තමයෝ, ඔවුනට, ඒසත්පුරුෂයන්ට, ඉසුරු,
ඓශ්චර්‍ය්‍යය, දෙතිදෙත්ය—

78 ප ස න් සුදන දිමට වණබවඅල ස
ල බ න් නවුත් පෙර කලැකල පවෙතිදෙ ස
න ම න් මුව විසුළුවූබව පෙනෙනවි ස
මෙනින් කවරවරදද නිසි දපනා ස

78 නමන්මුව, නමත්ශ්‍රීමුහුණ විසුළුවූබව, විකාරවූභා
වය, පෙනෙනම්ස, පෙනෙනුලබනවාම්ස, නිසි, සුදුසුවූ,
දපනපස, කැඩපත්තලෙහි, මෙනින්කවර වරදද, මෙනින්
කවර වැරැද්දෙක්ද, (මෙනින් වරදක් නැත්තේමය) (එ
මෙන්) පසන්සුදන, ප්‍රසන්නවූ සත්පුරුෂයා, දිමට, දීමපින
ස, අලසවනබව, ආලස්‍යවනබව, ලබන්නවුත්, ලබනවූන්
විසින්, පෙරකලැ, පූර්වකාලයෙහි, කල, කළාවූ, පවෙහි, පා
පයෙහි, දෙස, දෝෂයවේයි—

79 කෙරෙ හ් යුද උතුන් එළිගවර රලර ල
කි ය හ් මියුරු රසබස් සැලලිහිනිකැ ල
දෙතොත් යමෙක් යදිනලිමත් දුරහැර ල
වි ය හ් කමුත් විකුමුත් ඔවුවය නැබ ල

79 එළිනවර, එළුවන්ද ගවරයන්ද, රලරල, සමූහයෙන් ස
මූහය, උතුන්, ඔවුනොවුන්, යුදකෙරෙහ්, යුධකෙරෙත්ය,
සැලලිහිනිකැල, සැලලිහිනිපක්ෂිසමූහයෝ, මියුරුරසබස්,
මධුරවූ රසවචනයන්, කියත්, කියති, (ඒ සමඅඩබවක් විනු

මයක් නොවේයි) යමෙක්, යම්කෙනෙක්, යදි, යාචකයන්ගේ, කලිමත්, ලෝභසිත, දුරහැරල, දුරුකොට හැරලා, දෙනොත්, දිමනරතනොත්, නැබල, මහන්වූ, වියත්තමුන්, ව්‍යක්තකම්ද, විඥුමුන්, විඥමද, ඔහුමය, ඔහුසම්භන්ධමය.

80 සපෙක් එකෙක් කැවනසිතේ ඔහුමව ද
අතික් ලොවින් නොනැගෙසි එකම සනතු ද
පයක් දුදන පවුකළවූව ලංකලු ද
වගක් නසියි එමතුද වැණසෙයි ඔහු ද

80 සපෙක්, සර්පයෙකුවිසින්, එකෙක්, එක්සත්වයෙකු, කැව, දෂ්ටකලහොත්, නසිතේ, නසින්නේ, ඔහුමවද, ඔහුමවේය, ලොවින්, ලෝකයෙන්, අතික් එකම සතෙකුද, අන් එක්සත්වයකුත්, නොනැසෙයි, නොනසියි, පයක්, ප්‍රත්‍යක්ෂයෙන්, දුදන, දුර්ජනයා, පවුකලවූව, ප්‍රධානක ලේවිතම්ද, ලංකලද, ලංකලේනම්ද, වගක්, වර්ගයක්, නසියි, නැසෙයි, එමතුද, එපමනක්දනොව, ඔහුද, ඒදුර්ජනනැනැත්තන්ද, වැණසෙයි, විනාසවෙයි—

81 නොමිත් ලොවැ සියළුදේ දකිනා ඇස ට
තමත් සැටි මඳක්වත් නොපෙණෙණලෙස ට
අනුත් දෙස කිසති අනුවණ දනනප ට
එමෙත් සියළු ගුණනොදකිති නියමකො ට

81 නොමිත්, බොහෝසෙයින්, ලොවැ, ලෝකයෙහි, සියළුදේ, සියළුමදෙය, දකිණ, දකින්නාවූ, ඇසට, නේත්‍රයට, තමත්සැටි, තමන්ගේ සැටිය, මඳක්වත්, ස්වල්පයක්වත්, නොපෙණෙණලෙසට, නොපෙණෙන්නාක් මෙන්, අනුවන, අඥනවූ, කපටදන, වංචාකාර ජනයෝ, අනුත්දෙස, අනුත්ගේදෝෂ, දකිති, දකිත්ය, එමෙත්, එපරිද්දෙන්,

ස්‍යාවිතුණ, ගුණසිල්ප, නියමකොට, නියතකොට, නොද නිත්‍ය—

82 සසලය තරිඳු හිමරැසවෙයි හිමගිරි ඳු
කරඹය මුහුදු දිළිඳුවැ ඇවිදියි කිවි ඳු
නිසිදෙයමෙබඳු උවදුරැ දුරැවේය රැ ඳු
මෙදියත පසිඳු අපවගමය සුපිරිසි ඳු

82 තරිඳු, චන්ද්‍රතෙම, සසලය, සසලපය ඇත්තේවෙයි, හිමගිරිඳු, හිමාලපර්වත රාජතෙම, හිමරැසවෙයි, පිනිරසිය ඇත්තේවෙයි, මුහුදු, සමුද්‍රයතෙම, කරඹය, කරදිය ඇත් තේවෙයි, කිවිඳු, කවීන්ද්‍රතෙම, දිළිඳුවැ, දරිද්‍රව, ඇවිදියි, ඇ විදීය, නිසිදෙය, සුදුසුවූදෙය, මෙබඳු, මේආකාරවූ, රුදු, ම හත්වූ, උවදුරැ, උපද්‍ර, දුරැවේය, දුරිමකලේය, මෙදියත, මේලෝකයෙහි, සුපිරිසිඳු, අභිසයිත් පිරිසිඳුවූයේ, පසිඳු, ප්‍ර සිඬවූ, අපවගමය, නිර්වාණයමයි—

83 මැ ද හ ත් සුදනත්ගෙ විතරණ ගුනැතිසො ඳ
ම ද ව ත් වුව ගනිති ලිඳැදියමෙත් පැහැ ද
ණොපනත් ගුනැති දුදනත්ගේ දනනොම ඳ
නොගනිත් සදිදනෝ කරදියමෙත් මුහු ද

83 සොඳ, යහපත්වූ, විතරණගුනැති, ත්‍යාගගුන ඇත් තාවූ, මැදහත්, මැදහත්වූ, සුදනත්ගෙ, සත්පුරුෂයන්ගේ, ම ඳ වත්වූව, ස්වල්පවස්තුවවිනමුත්, ලිඳැ, ලිඳෙහි, දියමෙත්, ජලයමෙත්, පැහැද, ප්‍රසන්නව, ගනිති, (යාචකයෝ) ග නිත්‍ය, නොපනත් ගුනැති, පනතලෙස නොපවත්නා ස්වභාවඇත්තාවූ, දුදනත්ගෙ, දුර්ජනයන්ගේ, නොමඳ දනා, බොහෝවස්තුව, මුහුද, සමුද්‍රයෙහි, කරදියමෙත්, ල වනජලයමෙත්, යදිදනෝ, යාචකජනයෝ, නොගනිත්, නොගනිති—

84 දිගුත් සුදුකරණසඳ අමරැසින්යු ත
සයත් නොහරිනෙවි කප්තිම් තමන්ග ත
අනුත් දුකට සුදනෝනොක තැන්කර ත
තමත් ගෙකාටයුතුවට එලෙස නොමවෙ ත

84 දිගුත්, දිසාවත්, සුදුකරණ, සුදුපැහැකරන්නාවූ, අ
මරැසින්යුත, අමෘත රශ්මියෙන් යුක්තවූ, සඳ, චන්ද්‍රයා, ත
මන්ගත, තමන්ගේ සැරීරයෙහි; සසත්, සසලපය, කප්තිම්,
කල්පසීමාවදක්වා, නොහරිනෙවි, නොහරින්නාක්මෙන්,
අනුන්, අන්‍යයන්ගේ, දුකට, දුඃඛයට, සුදනෝ, සත්පුරු
ෂෝ, නොකතැන්, අනේකෝත්සාහය, කාත, කරන්ය, ත
මන්ගෙකටයුතුවට, තමන්ගේ කාතිව්‍යයපිනිස, එලෙස, එ
සේ, නොමවෙත, නොමවෙති—

85 වනත් නොයෙක් ගංහෝඅැල කඳුරැපැ ණ
මහත් ගැඹර සිඳුනොයනෙවි වෙරලපැ ණ
ලදත් මෙමුළු දඹදිවැ රජසිරි සුද ණ
සිරිත් ලෙසට පවති උඩගු නොවම් ණ

85 නොයෙක්, අනේකවූ, ගං, ගඞ්ගාවන්හිද, හෝ, ඔය
වල්හිද, ඇල, ඇලවල්හිද, කඳුරැ, කඳුරැලිවලද, පැන, ජ
ලය, වනත්, පැමුනුනානමුත්, මහත්, මහත්වූ, ගැඹර, ගම්
භීරවූ, සිඳු, සමුද්‍රය, වෙරලපැන, වෙරලඉක්ම, නොයනෙ
වි, නොයන්නාක්මෙන්, සුදන, සත්පුරුෂතෙම, මේමුළුදඹ
දිවැ, මේසියළු ජම්බුද්වීපයෙහි, රජසිරි, රාජ්‍යශ්‍රීය, ලදත්, ලදු
වත්, උඩගුනොවම්න, උඩගුනොවමින්, සිරිත්ලෙසට, චා
රිත්‍රලෙසට, පවති, පවතිය—

86 පැනසර නොවනසත නිති සුදනත් පැහැ ර
කර දර දුදන සමගවැ වෙසෙහි හැමව ර
මනහර ගජකුඹින් මුත්දමුතු මුතුහැ ර
උරසුර සනු ඔහිදඹ්සුවැනි වැසිසබ ර

86 පැනසර නොවන, ප්‍රඥාසාර නොවත්නාවූ, සත, සත්වයෝ, නිති, නිරන්තරයෙන්, සුදනන්, සත්පුරුෂයන්, පැහැර, අත්හැර, කරදර, කාරබාරිවූ, දුදනසමග වැ, දුර්ජනයන්හා එක්ව, හැමවර, සැම කල්හී, වෙසෙති, වාසය කෙරෙත්ය, (ඒසෙයේද) මනනර, මනෝහරවූ, ගජ කුඹින්, හස්තිකුම්භයෙන්, මුත්, මුක්තවූ, (ගැලවිවැටූනාවූ) දිමුතු, දීප්තිමත්වූ, මුතු, මුක්තාවන්, හැර, අත්හැර, සබරවැසි, සබරවැසියන් විසින් හෙවත් වැද්දන්විසින්, ඔහිදබිජු, ඔහිදඇටවලින්, උර, උරඃස්ථලය, සරසනවැනි, සාසන්නාක්මෙනි—

87 සොඳුරු ගුණනුවන යුතු උතුමෝ පත ර
නපුරු දුදනසහ එක්වූව වෙතිඅස ර
රුදුරු කටුපහනනැති සමතල හස ර
අඳුරු සමඟ වූකලැ වේය බියක ර

87 රුදුරු, රෞද්‍රවූ, කටුපහන, කණ්ටකපාසානයන්, (කටුහාගල්) නැති, නැත්තාවූ, සමතල, සමතලාවූ, හසර, මාගීය, අඳුරු සමඟවූ කලැ, අන්ධකාරයහා එක්වූකල්හී, බියකරවේය, භයන්කාරයවෙයි, (එමෙත්) පතර, මහත්වූ, සොඳුරු, යහපත්වූ, ගුණනුවන, ගුණයෙන්හා ඥානයෙන්, යුතු, යුක්තවූ, උතුමෝ, උත්තමයෝ, නපුරුදුදනසහ, නපුරු දුර්ජනයන්හා, එක්වූව, එකතුවූකල්හී, අසරවෙති, අසාරවෙති.

88 තිරසර ගුනැති සුදනෝ පරවැඩ නැති ද
වරසුර පුරෙහිවත් නොවසති නිරයෙලෙ ද
ඝොරතර නිරෙහිවත් ඔවුනට වැඩඇති ද
සුරපුර ලෙසට හැසිරෙත් සුදනෝ පබ ද

88 තිරසරගුනැති, ස්ථිරසාර ගුනඇත්තාවූ, සුදනෝ, සත්පුරුෂයෝ, පරවැඩ, පරහි වෘද්ධියක්, නැගිද, නැත

හොත්, චර, උතුම්වූ, සුරපුරෙහිවත්, දිව්‍යපුරයෙහිනමුත්,නි රයලෙද, නරකයෙහි මෙන්, නොවසති, වාසය නොකරෙ ත්ය, ඔවූනට, ඒඅන්‍යසත්වයන්ට, වැඩඇතිද, වෘධිඇත හොත්, ඝොරතර, ඝෝරතරවූ, නිරයෙහිවත්, නරකයෙහි නමුත්, සුරපුරලෙසට, දිව්‍යපුරයෙහිමෙන්, පබඳ, ප්‍රසිඞවූ,සු දනෝ, සත්පුරුසයෝ, හැසිරෙත්, සංචාරණයකෙරෙති.

89 පහ නි ත් පහත් සියගනනක් ඇවූළුව ද
එ පහ ත් සිලෙහි අළුඅඩුනොවැ දිලෙනලෙ ද
ලොවැඅත් සතුන් ගුනපලකරමින් නිබ ද
සුප ස ත් ගුනෙන් වැජබෙහි සුදනෝ පබ ද

89 පහනින්, ප්‍රදීපයෙන්, (පානෙන්) පහත් සියගනනක්, ප්‍රදීපශතසංඛ්‍යාවක්, ඇවූළුවද, ඇවූළුවත්, එපහත්සිලෙහි, ඒ පාන්දැල්ලෙහි, අළු, ආලෝකය, අඩුනොවැ, අඩුනොවී, දිලෙනලෙද, දිලිහෙන්නාක්මෙන්, නිබඳ නිරන්තරයෙන්, ලොවැ, ලෝකයෙහි, අන්සතුන්, අන්‍යසත්වයන්ගේ, ගුන, ගුනය, පලකරමින්, ප්‍රකාසකරමින්, සුපසත්ගුනෙන්, ඉතාප්‍රසන්නවූගුනයෙන්, පබඳ, ප්‍රසිඞවූ සුදනෝ, සත්පුරුෂයෝ, වැජඹෙති, විජෘම්භිතවෙති—

90 ග ජ කු ම් බිඳින එකසර කෙසරිඳු බලැ ති
කොතරම් සාවූවත් තණකබලනුබුදී ති
චි හි ගු ම් කුලෙන් යුතුඋතුමෝ අබිමනැ ති
දි වි හි ම් කොටත් නොතරම්කම් නොමකෙරෙ ති

90 ගජකුම්,හස්තිකුම්භය, බිඳින,භේදනයකරන්නාවූ, එකසර, ඒකචාරිවූ, (තනිකරහැසිරෙන්නාවූ) බලැති, බල ඇත්තාවූ, කෙසරිඳු, සිංහරාජයෝ, කොතරම්, කොතෙක් ප්‍රමාන, සාවූවත්, ක්ෂුධාවූවත්, (බඩගිනිවූවත්) තණකබල,

තෘනභෝජනය, (තනකොලආහරය) නුබුදිති, අනුභවනො, කරෙත්ය, (එමෙන්) විහිනුම්කුලෙන්, මහත්කුලයෙන්, යුතු, යුක්තවූ, අබිමනැති, අභිමාන් ඇත්තාවූ, උතුමෝ, උත්තමයෝ, දිවිගිම්කොවත්, ජීවිතය නැලවරකොවද, නොනරම්කම්, නුසුදුසුකම්, නොමකෙරෙති, නොකරෙත්ය.

91 බ ල යු ත් තුමුල මතවරනිදු මෙදැනැවි ස
දි ව ත ත් සෙද තමන්සොඩ නොම්ඩින විල ස
ල දු ව ත් නැනැතිදන මුළුලොවැ ඉසුරුැරැ ස
නොපතත් දෙයක් නොකරති නිසිදේමම් ස

91 තුමුල, මහත්වූ, බලයුත්, බලයෙන්යුක්තවූ, මතවර නිඳු, මත්තහස්තිරජයා, මෙදෙනැවිස, මදයෙන් ඇවිස්සී, සෙද, හීග්‍රයෙන්, දිවතත්, ධාවනයකරනත්, තමන්සොඩ, තමන්ගේසොඩ, නොමඩිනවිලස, ආක්‍රමනය නොකරන් නාක්මෙන්, (නොපාගත්නාක්මෙන්) නැනැතිදන, ඥනවන්තජනයෝ, මුළුලොවැ, සියළුලෝකයෙහි, ඉසුරුැරැස, ඓශ්චර්‍යරාසිය, ලදුවත්, ලදනමුත්, නිසිදේමම්ස, යෝග්‍ය දේමම්සක්, නොපනත්දෙයක්, නොපනත්වූ දෙයක්, නොහොත් පනතවිරුද්ධවූදෙයක්, නොකරති, නොකෙරෙත්ය.

92 ප ස ක් මුනිදු සමයම නොගෙනැ සුනිම ල
අ නි ක් කුදිටුගෙනැ ලෙව්සත, නැනවිකා ල
එමොක් පුරට පැමිනෙන සම්කල එක ල
අ ඳෙක් දුක්කහෙයි විපදය නුබත ල

92 පසක්, ප්‍රත්‍යක්‍ෂවූ, මුනිඳු, මුනින්‍ද්‍රයාගේ, සුනිමල, ඉතානිර්මලවූ, සමයම, ආගම, නොගෙනැ, ග්‍රහනයනොකොට, ලෙව්සත, ලෝකසත්වයා, නැනවිකල, ඥනවිකලයෙන්, අනික්කුදිටු, අනික්මිත්‍යාදෘෂ්ටි, ගෙනැ, ග්‍රහනයකො

ට, එමොක්පුරට, ඒමෝක්‍ෂපුරයට, යම්කලෙ, යම්කාලයෙක්හි, පැමිනෙන,පැමිනෙනහොත්, කළුල, එකල්හි, අඳෙක්,අඤ්ඩයෙක්, තුබතල, ආකාසතලයෙහි,විපදය, පක්‍ෂිපාදය,(කුරුළුඅඩිය) දක්නහෙයි, දකිනයකලහැකිවෙයි,

93 නා ද න ගුනනුවනයුතු උතුමෝ මහ ත
නොගෙන කිසිකරුණු සත සුවපත්කර ත
දි ලෙ න සාවඩුළු යුතු තුරුපෙල දිමු ත
ය නෙ න සත සනපමිත් ගිම්දුර හරි ත

93 දිලෙන, දිලිහෙන්නාවූ, සාවඩුළුයුතු, ශාඛාවණ්ඩලයෙන් යුක්තවූ, දිමුත, දිප්තිමත්වූ, තුරුපෙල, වෘක්‍ෂපන්තිහු, යනෙනයත, යනඑන්නාවූ සත්වයා, සතපමින්, සතප්පමින්, ගිම්, ග්‍රීෂ්මය, දුරහරින, දුරහරිත්ය, (එමෙන්) නාදනා, සතුටුඑලවන්නාවූ, ගුණනුවණයුතු, ගුනයෙන්හා ඥානයෙන්යුක්නවූ, මහන, මහත්වූ, උතුමෝ, උත්තමයෝ, කිසිකරුණු, කිසිකාරණයක්, (කිසිදෙයක්) නොගෙණ,ග්‍රහණයනොකොට,සත,සත්වයා,සුවපත්කරත,සැපතටපමුනුවති.

94 ඉසු රෙ ත් රුවින් සරිඅයවෙසෙනත් නොම ද
කුළුනෙත් ලොවරකිණු එක්උතුමෙකි පබ ද
මැඩි ය ත් බුදින නා කැල ඇතිවද විස ද
ද ර මි න් දෙරණ සිටිතේ නතනාමව ද

94 මැඩියත්,මණ්ඩුකයත්; බුදින, අනුභවකරන්නාවූ,විසද,බොහෝවිසඇත්නාවූ,නාකැල,නාගසමූහයා,ඇතිවද,ඇතිනමුත්, දෙරණ, ධරනීය, දරමින්,ධාරණයකරමින්, සිටිතේ, සිටින්තේ, නතනාමවද, අනන්තයාමවෙයි, (එමෙන්) ඉසුරෙන්, ඓශ්චර්‍යයෙන්, රුවින්, රූපයෙන්, සරිඅය, සමානඅය, නොමඳ, බොහෝසේ වෙසෙනත්, වංසයක

රතත්, ලොව, ලෝකය, කුළුනෙන්, කරුණාවෙන්, රකිණු, රක්ෂාකරණු පිනිස, පබඳ, ප්‍රසිද්ධවූ, එක්උතුමෙකි, එක් උත්තමයෙක්වෙයි—

95 තැනතැන නිදන් කොට නොතබා හැමදින ම
කව බොව සදින් හට දන්දෙව වඩාපෙ ම
මිහි බැඳි බි හු න් හට වණලෙස දූකදූක ම
තව තව ලොබින් දනරැස්කොට තබනුකි ම

95 තැනතැන, තැනින්තැන, නිදන් කොට, නිධාන කොට, නොතබා, තැබීම්නොකොට, හැමදිනම, සැමදවස්හිම, කවබොව, අනුබවකරව පානයකරව, පෙමවඩා, ප්‍රේම වර්ධනයකොට, සදින්හට, යාචකයන්ට, දන්දෙව, දානය දෙව, මිහිබැඳි, මිබැන්දාවූ, බිහුන්හට, භාර්යයන්ට, වණ ලෙස, වන්නාවූ විලාසය, දූකදූකම, දර්ශනයකොටකොට ම, තවතවලොබින්, තවතවලෝභයෙන්, දන, ධනය, රැස් කොට, රාසිකොට, තබනු, තැබීම, කිම, කිමෙක්ද—

96 තිගින් දුදන සමගවැ සුදන විසුව ද
පසත් ගුණෙන් ලොවැ සතහටවෙති සුහ ද
රිවූත් විමණ ඇතිවූණු කොවුලත්ගෙත ද
අසත් නාවුන් යුගසවනාට මිහිරිව ද

96 රිවූත්, කපුටුවන්ගේ, විමණ, විමන්හි, ඇතිවූණු, වැඩුනාවූ, කොවුලන්ගෙ, කෝකිලයන්ගේ, නද, නාදය, අසත්නාවූන්, අසනාවූන්ගේ, යුගසවණට, ශ්‍රවණයුග්මයට, මිහිරිවද, මධුරවෙයි, (එමෙන්) තිගින්, නිරන්තරයෙන්, දුදන සමගවැ, දුර්ජනයන්හාඑක්ව, සුදන, සත්පුරුෂයෝ, විසුවද, වාසයකලත්, පසත්ගුණෙන්, ප්‍රසන්නගුණයෙන්, ලොවැ, ලෝකයෙහි, සතහට, සත්වයාට, සුහදවෙති, සුහෘද

චෛත්‍ය, හෙවත් යහපත් සිත්ඇත්තානුවෙති—

97 නොමිත් මහ පිණැතියෙක් පසිඳු මෙදිය  න
කුලෙත් අඹුවැ උපනත්ලොවැ නැනැතිස  න
නොසිත් අදර බුහුමත් වඩමින් පුද  න
ම ඬි ත් උපත් ඉඳුවර පලඳිනෙවම  න

97 මෙදියන, මේලෝකයෙහි, නොමිත්, බොහෝසෙයින්, පසිඳු, ප්‍රසිද්ධවූ, මහපිනැතියෙක්, මහත් පුන්‍යවන්තයෙක්, කුලෙත්, ගෝත්‍රයෙන්, අඹුවැ, අඹුවී, උපනත්, උපන්නාවුත්, ලොවැ, ලෝකයෙහි, නැනැති, ඥානවන්තවූ, සත, සත්වයෝ, නොසිත්, තෝෂයෙන්, අදරබුහුමත්, ආදරබහුමානා, වඩමින්, වර්ධනකරමින්, පුදනා, පූජාකෙරෙත්ය, මඬිත්, මඬෙත්, උපත්, උපත්නාවූ, ඉඳුවර, ඉන්දීවර, (මාණෙල් මල්) මත, මස්තකයෙහි, පලඳිනෙව්, පලඳින්නාක්මෙනි.

98 බුදිත් මිහිරි මීඅඹරසය සතොසි  න
ඉඳිත් සොඳුරැ ගෙළයත්වල තුරැමුදු  න
සිරිත් මෙඅැ කරනත් කොවුලත්ලෙසි  න
වසත් කලැ දූනෙයි රිටු පරපුටු නාදී  න

98 මිහිරි, මධූරවූ, මීඅඹරසය, මධූරාම්‍රරසය, සතොසිනා, සන්තෝෂයෙන්, බුදිත්, අනුභවකෙරෙත්ය, සොඳුරැ, සුන්දරවූ; තෙළයත්වල, ශාඛෝද්‍යාන යන්හි, තුරැමුදුන, වෘක්ෂ මස්තකයෙහි, ඉඳිත්, ඉඳිත්ය, මෙඅැ, මේආදීවූ, සිරිත්, චාරිත්‍ර, කොවුලත්ලෙසින, කෝකිලයන්මෙන්, කරනත්, කරණනාවුත්, නදින, නාදය කරණකොටගණ, රිටු පරපුටු, කපුටුවන්ද කෝකිලයන්ද, (යන මොවුන්ගේවෙනස) වසත් කලැ, වසන්තකාලයෙහි, (බස්වෙසක් දෙමසෙහි) දූනෙයි, ජානනයවෙයි—

99 නොකරජ සිරිස් පුරිඳුව සියගුණෙණත්වෑ ත
රෑ පුර ජ ගජන් එකසර කෙසර ලෙසමෑ ඞ
දින රජ කුල පහනැබැඳිමහඟු රත්කො ඞ
සිරි රජ සිහරජුගෙ සිරිපද සෙවණැවෑ ඞ

99 නො.ත, අනේකවූ, රජසිරින්, රාජ්‍යශ්‍රීයෙන්, පූරිඳා, පූරෝකදුයාව, සියගුණෙන්, සියස්ගුණයෙන්, වෑඩි, වෑඩිව, එකසා, එකචාරිවූ, කෙසරලෙස, සිංහයෙක්මෙන්, රෑපුරජ, සතුරුරජනම්වූ, ගජන්, හස්තීන්, මෑඩි, මඩිනලාවූ, දිනරජකුල, සූර්යවංශනම්වූ, පහන, ප්‍රසාදගුණයෙහි, බැඳී, බඳනාලද, මහඟු, මහාර්ඝවූ, රත්කොඩි, රත්රන්කොඩි ඇත්තෑනිවූ, සිරිරජ සිහරජුගෙ, ශ්‍රීරාජසිංහ රජුගේ, සිරිපදසෙවණ, ශ්‍රීපාදච්ඡායාවයෙහි, වෑඩි, වෑඩුනාවූ—

100 විජම් පෙලසයුර සෑදිමොක් වෙරලති ත
සියුම් නියතලෙත්ගත් කුඹු යොත්සිරි ත
උතුම් හිස්වෑල්ලනම්ගම හිමිසොබ ත
දහම් දජනමෑති පඬිවරහුට නද ත

100 මොක්, මෝක්ෂනම්වූ, වෙරලතින, වෙරළින්, සෑදී, සෑදූනාවූ, විජම්පෙල, අභිධර්මපාලිනම්වූ, සයුර, සාගරය, සියුම්, සූක්ෂමවූ, නියතලෙත්, (නී අතලෙත්) ඥානනම්වූ හස්තතලයෙන්, කුඹුයොත්සිරින, කුම්භයෝනියා මෙන් හෙවත් මහාඅගස්ති ඍෂිවූ අගස්තිරෑෂියාමෙන්, ගත්, ගෘහනකලාවූ, උතුම්, උත්තමවූ, හිස්වෑල්ලනම්ගම, හිස්වෑල්ලනම් ග්‍රාමයා, හිමි, ස්වාමිවූ හෙවත් අධිපතිවූ, සොබන, සහපත්වූ, දහම්දජනම්වූ, ධර්මධ්වජ යන නාමයක් ඇත්තාවූ, පඬිවරහට, පණ්ඩිතෝත්තමයාහට, නදන, පුතවූ—

101 නිති සුපසන්න සරසවි රැඳි මුවතඹ ර
කිවිගජ බින්න කල එකසර කෙසරයු ර
අලගිය වත්න මූනවෙවි තමැති කිවිය ර
සුතුපද සන්න මේකවි කලෙය අමයු ර

101 සුපසන්න, ඉතාප්‍රසන්නාවූ, මුවතඹර, මුඛනමැති තාම්‍රසයෙහි, නිති, නිරන්තරයෙන්, සරසවි, සරස්වතීය, රැඳි, රැඳුනාවූ; කිවිගජ, කවීන්නමැති හස්තීන්, බින්න කල, භග්නකලාවූ, එකසර, ඒකචාරීවූ, කෙසරායුර, සිංහ යෙක් වැනිවූ, අලගියවත්න මූනවෙවි තමැති, අලගියවත් නාමූනවෙවියනනාමයක්ඇත්තාවූ, කිවියර, කාව්‍යකාරකයො ම, පදසන්න, පද්‍යසන්නයෙන් හෙවත් පූරාණාචාර්‍ය්‍ය කී යමත්වල සන්නවිලාසයෙන්, සුතු, සුත්තාවූ, අමයුර, අමෘතාකාරවූ, මේකවි, මේකාව්‍යය, කලේය, කලේයි [illegible]

නිමි.

---

## වශයකාරයේ සමහර අදහස්වලට එකහව අළුතෙන් සාදනලද කවි.

1 සැප ව අනතුරැව පැමිනෙයි නොමඳ දු ක
දු ක ව අනතුරැව සැප පැමිනෙයි පස ක
ලෙසට රියසකය සැපසහදුක මෙදෙ ක
එ පි ට මෙපිට පෙරලෙත් දූනගත් නිස ක

2 විදිනට කැමති පස්කම්සැප නිවතුනු ද
දබ ර ව කැමති සෙත්කය බලනැති අය ද
කාරණට වාද කැමතිවිසත නොදත්තු ද
පෙරසිට කියති පඩුවෝමුත් දනයිද ද

3 දු ද න සහර බරනිත් සැරැනොද පව ර
කෙරෙ න පඬිකමට නොමගෙණ කෙරෙතිදු ර
නොම් න දිලෙන කටමිණයුතු සපෙතුගො ර
පෙ මි න ලත්කෙරෙද බියනොහැව සතනිත ර

4 කුලයෙන් අඩුවූවත් දනවත්නම් නොම — න
සිබ දී ත් පුදකෙරෙත් ලොවදන තුටුසිති — න
සුප සත් සඳසෙ කුලයෙහි උපනත් සොබ — න
නිව තු ත් හා නිගාදෙත් ලොව සතනිති — න

5 මි ය ප ර ලොව යනු කල ලොවසත සස — ඳ
ගෙ ය හැ ර නොයෙයි දනකලඑකතු ලොබබැ — ඳ
වැ සි දු ර නොයෙයි සොහොනටමිස සිඳසබ — ඳ
නොමහැර සමග යෙත්තම කල හොඳ නොනො — ඳ

6 නැත සමදෙක් තමුගත් සතර මිස — වෙ ණ
නැත සතුරෙක් රෝලුකහා සඳිසි — වෙ ණ
නැත අද රෙක් අරුවත්හට ඇතිසෙ — වෙ ණ
නැත බල යෙක් තමවාසත බලසෙ — වෙ ණ

7 යිමෙ ක් මෙලොවදී කල කුසල අකුස — ල
සැ නක් සොවම පරලොවදී දේසප — ල
රු කක් මුලට වත් කරමින් වැඩුවජ — ල
එ රු ක් අතුඅගින් දෙයි කුසුම පළප — ල

8 දු ද න ත් සහ වුවොත් සුදනත් නොවලසි — ණ
පැමිනෙත් තේය අකාටයුතු බවකාට නොමි — ණ
සු ප ස ත් මියුරු සිසිලස්ගුණ ඇතිවූපැ — ණ
ගිනි ව ත් කල නැසෙනු එමසියළුම සුගු — ණ

9 සොවූනොත් රුවින් දිසිමුත් යමෙක් පිරිසි — දු
දෙ කුලෙත් ගුතුවවත් සකසහ කිරමබ — දු
සු ප ස ත් සතර නොමදනහොත් ලොවපසි — දු
සු ව ඳි ත් මුත් කැලමලකට වේයබ — දු

10 නිගිනා සපුද දුදනාද කුරිරශ නොමී — ණෝ
දු ද නා සපුට වැඩියෙන් කුරිරැශ මෙසී — ණෝ
ඔ සුනා මතුරයෙන් සපු කලහැකි දම — ණෝ
දු ද නා කවර කරුනෙත් කලහැකි දම — ණෝ

11 එනර නොවන අලසනුසන තුඹිනිතැ නී
පනර සැප කා මිහිඳුදඅය රෝදුකැ නී
නිතර නිදනානුදඅය රජගෙලි කැම නී
සනර ඉගණගැත්මට අසම්ගෝගව නී

12 කූ පූ රූ දු කලනොත් සැව සනරම් වි ස ය
නෙ දිරූ නැනා ගොජ්න ගුබව කල වි ස ය
සෙ දුරූ සවිසදන දිරිදු ගතා වි ස ය
එ යු රූ මිනඑනවවෙස් නරුණීය වි ස ය

13 අ නූ ත් නෙ ගෙවසාම්ද නො නැඟු කල ව
නොම්ත් ඩිනිම්ද උතුරක් නොඇසුව් ව
නා ම ත් කලනවණ පැවිසීම්ද ලොව ව
මෙ ව ත් ලසුනැනැයි දනු අනුවණ සන ව

14 නොවූලත් ගේ රුවණම් මිනුරු නදන මා
අඟ නා ත් ගේ රුවණම් පතිවත රැකු මා
අ රූ ප ත් ගේ රුවණම් සත උනත්පෙ මා
ත ප සු ත් ගේ රුවණම් ඉවසීමන මා

15 බත්නා හිඳිනානුගෙ සිරුරය නර වේ ඒ
බත්නා සිටිනානුගෙ අඟ බලවැඩි වේ ඒ
බත්නා සනුණනුගෙ ආයුස වැඩි වේ ඒ
බත්නා දුවනානව මරණය අත් වේ ඒ

16 රජඅබිසෙස් කෙරුම්ද සතුරන් නැසූ ම
නරුනාදිනැස් දිම්ද දනා රැස්ගෙතරු ම
සනා ඉගෙනුණනැත්මද රෝසම්ගෙතුරු ම
නොපුරුස කලොාන් යහපතිකිවූ පොසිව ම

17 ම හ තු ත් සෙවූත්කල ඒහුදනමුත් නොම ද
නූ ප ස ත් ඉසුරු ලැබනණවොත් ලොව පබ ද
නොමිදිත් දිලෙනා රන්ගිර සොවන්කල ද ද
රත් ව ත් බවව පැමිණොත්කිවූ පොරඩිද ද

නිමි.